**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අංශයේ ප්‍රකාශනයකි.**


# 5 වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව පෙරහුරු පරීක්ෂණය 2024

## ප්‍රශ්න පත්‍ර අංක 01 - I පත්‍රය

**විභාග අංකය : .......................................... කාලය පැය :- 1යි.**


- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු තුන බැගින් ඇත. එක් එක් ප්‍රශ්නයට අදාළ නිවැරදි පිළිතුර තෝරා ගෙන ඊට යටින් ඉරක් අඳින්න.

(01) මුල් රූපයට සමාන රූපය තෝරා යටින් ඉරක් අඳින්න.



(1) (2) (3)


(02) මුල් රූපයට වඩා වෙනස් රූපය තෝරා යටින් ඉරක් අඳින්න.



(1) (2) (3)

- අංක 03 හා 04 ප්‍රශ්නවල රූප ලක්ෂණ දෙකක් මත කාණ්ඩ දෙකකට බෙදිය හැක. එම කාණ්ඩ දෙක නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.


(03)



A B C D

(1) AC හා BD (2) AB හා CD (3) DA හා BC

**(04)**



A B C D

(1) AD හා BC (2) CB හා DA (3) AC හා BD

- **අංක 05, 06 ප්‍රශ්නවල හිස්තැනට සුදුසු පිළිතුර තෝරන්න.**

(05) අලුත් එළවළු හා පළතුරු ආහාරයට ගැනීමෙන් අපේ ශරීරයට .......................................ලබා ගත හැක.

(1) විටමින් (2) ප්‍රෝටීන් (3) පිෂ්ඨය

(06) පොත, පත්තරය දෘශ්‍ය මාධ්‍ය නම් රූපවාහිනිය, අන්තර්ජාලය

(1) ශ්‍රව්‍ය මාධ්‍ය වේ. (2) දෘශ්‍ය මාධ්‍ය වේ. (3) ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය වේ.

- **පහත වචන යෙදී ඇති රටාව තේරුම් ගෙන අංක 07 සහ ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(07) හිස්තැනට ගැළපෙන වචනය තෝරන්න.

මහන ⟶ නහය ⟶ යහන ⟶ නහර ⟶ .............................

(1) රසය (2) රවන (3) රහස

(08) නොගැළපෙන වචනය යටින් ඉරක් අඳින්න.

(1) නදිය (2) නමන (3) නහය

- **පහත කවිය කියවා නිවැරදි පිළිතුර තෝරන්න.**

මහවැලි කැලණි කළු වලවේ යන ගංගා
සමනොල කන්ද මුදුනේ සිට පැන නැංගා
බෑවුම් තැනිතලා හෙල් අතරින් රිංගා
මේවා ගලයි මිණි කැට දිය යට හංගා


(09) කවියේ සඳහන් 'පැන නැංගා' යන වචනයේ තේරුම,

(1) ආරම්භ වුණා (2) උඩ පැනීම (3) අවසාන වුණා


(10) කවියේ 'මිණි කැට' යන්නෙන් අදහස් කරන්නේ මොනවාද?

(1) මැණික් (2) රත්තරන් (3) මුතු කැට


(11) රූපයේ දැක්වෙන්නේ යම් පුද්ගලයෙකු සතු ඉඩමකි. එහි හරි මැද ඇත්තේ ළිඳකි. ළිඳ දෙපස පෙළට පොල් ගස් 4කි. මෙම පුද්ගලයා තම දරුවන් 4 දෙනාටම ළිඳට පැමිණිය හැකි ආකාරයටද, සෑම දරුවෙකුට ම පොල් ගසක් අයිතිවන ආකාරයටද ඉඩම කොටස් කරයි. ඔහු ඉඩම බෙදීමට වැට ගැසූ ආකාරය දැක්වෙන පිළිතුර තෝරන්න.




(1)




(2)



(3)



(12)




(1) 5 (2) 3 (3) 6

(13) තාත්තා ගඩොල්කැට 3ක් ගෙන යන විට පුතා ගඩොල් කැට 2ක් ගෙන යයි. ගඩොල් කැට 69ක් රැගෙන යාමට තාත්තා හා පුතා සමාන වාර ගණනක් යයි නම් දෙදෙනාට ම යා යුතු වාර ගණන කීය ද?

(1) 13 (2) 15 (3) 14

(14) ගගනගේ නිවසේ ඇති ඔරලොසුවේ වේලාව නියමිත වේලාවට වඩා මිනිත්තු 15ක් අඩු ය. ඒ අනුව පෙ.ව. 6.20 ට පිටත් වූ ගගන පාසලට යන විට පාසලේ ඇති නිවැරදි වේලාව දක්වන ඔරලෝසුවේ වේලාව පෙ.ව. 7.15 විය. ඔහුට නිවසේ සිට පාසලට යාමට ගත වූ කාලය කොපමණ ද?

(1) මිනිත්තු 55 (2) මිනිත්තු 40 (3) මිනිත්තු 15

(15) 2020 වර්ෂයේ ජනවාරි 01 බදාදා නම් එම වර්ෂයේ මැයි 01 යෙදෙන දවස කවදා ද?

(1) බ්‍රහස්පතින්දා (2) සිකුරාදා (3) බදාදා

(16) බස් රථයක කොන්දොස්තර කෙනෙකු ළඟ රු. 2.00 සහ රුපියල් 5 කාසිවලින් රුපියල් 71.00 මුදලක් තිබුණි. ඔහු ළඟ තිබුණු පහේ කාසිවල වටිනාකම කොපමණ ද?

(1) රු. 40.00 (2) රු. 35.00 (3) රු. 38.00

(17) 180 මෙන් ½ ට 30ක් එකතු කර 2න් බෙදූ විට ලැබෙන පිළිතුර වන්නේ,

(1) 60 (2) 90 (3) 45

(18) එක් හඳුන්කුරක් මිනිත්තු 8ක් දැල්වේ. පළමු හඳුන්කුර දල්වා මිනිත්තු 3කට පසු ඊළඟ හඳුන්කුර දල්වයි. මෙලෙස හඳුන්කූරු 3ක් දැල්වුවහොත් හඳුන්කූරු 3 ම දැල්වෙන කාලය කොපමණ ද?

(1) මිනිත්තු 3 (2) මිනිත්තු 2 (3) මිනිත්තු 4

(19) මිනිත්තුවක දී ටැංකියකට ජලය 30$l$ පිරෙයි. මිනිත්තු 04 කදී ටැංකියෙන් ⅕ ක් ජලය පිරෙයි. ටැංකියෙන් ½ ක් පිරීමට ගතවන කාලය කොපමණ ද?

(1) මිනිත්තු 10 (2) මිනිත්තු 20 (3) මිනිත්තු 8


(20) ඔරලෝසුවක පැය කටුව මධ්‍යම රාත්‍රී 12 සිට මධ්‍යාහ්න 12 තෙක් ගමන් කිරීමේ දී අතරමග පසු කරන පැය ගණන වන්නේ,

(1) පැය 12 (2) පැය 23 (3) පැය 11

(21) 258, 635, 364, 972 මෙම සංඛ්‍යා ආරෝහණ ක්‍රමයට ලියූ විට ලැබෙන තුන්වෙනි සංඛ්‍යාවේත් හතරවන සංඛ්‍යාවේත් මැද ඉලක්කම් පිළිවෙළින්,


(1) 5 හා 6 (2) 3 හා 7 (iii) 6 හා 7

(22) රූපයේ අඳුරු කර ඇති කොටස් දැක්වෙන භාගය නොවන්නේ,



(1) $\frac{4}{8}$ (2) $\frac{2}{4}$ (3) $\frac{3}{8}$

(23) මෙම රූපයේ ත්‍රිකෝණ ගණන කීය ද?



(1) 18 (2) 22 (3) 12

(24) තාත්තාගේ වයස පුතාගේ වයස මෙන් දෙගුණයකි. තාත්තාගේ සහ පුතාගේ වයස්වල මුළු එකතුව අවුරුදු 81කි. තාත්තාගේ වයස කීය ද?

(1) අවුරුදු 27 (2) අවුරුදු 40 මාස 6 (3) අවුරුදු 54

(25) රුපියල්, රුපියල් දෙක, රුපියල් පහ යන කාසි වර්ග තුන ම යොදා ගෙන රුපියල් 21 ක මුදලක් අඩු ම කාසි ගණනකින් ගෙවීමට අවශ්‍ය මුළු කාසි ගණන කීය ද?

(1) 5 (2) 6 (3) 7

(26) v සිට xv තෙක් රෝම සංඛ්‍යා ලිවීමේ දී i යෙදෙන වාර ගණන කීය ද?

(1) 14 (2) 15 (3) 16

(27) මුව රැළ දිය බීමට දිය වළ කරා ආ යුතු ය.

ඉහත වාක්‍යය යේ වෙත යන අර්ථය දෙන වචනය කුමක් ද?

(1) කරා (2) දිය (iii) රැළ

(28)

| ස් | හා | ම | ස | ය | ති | රා | ම |
|---|---|---|---|---|---|---|---|

ඉහත කොටු තුළ ඇති අකුරු සියල්ල ම යොදා ගෙන සෑදිය හැක්කේ කවර වර්ගයේ නාම පදයක් ද?

(1) සත්ත්ව නාමයකි.
(2) ද්‍රව්‍ය නාමයකි.
(3) ස්ථාන නාමයකි.

(29) 684 : 243 නම් 846 : .............. ට කීය ද?

(1) 324 (2) 234 (3) 342


(30) පැයට 60km ක එකම වේගයෙන් ගමන් කරන මෝටර් රථයක් පැය 2 මිනිත්තු 30 ක දී ගමන් කරන දුර වන්නේ,

(1) 120km (2) 150km (3) 140km

(31) කුමාර උදෑසගන පාසල් යන විට ඔහුගේ දකුණු අත පැත්තෙන් සෙවණැල්ල වැටී තිබුණේ ය. ඔහු ගමන් කළ දිශාවට විරුද්ධ දිශාව කුමක් ද?

(1) උතුරු දිශාව (2) දකුණු දිශාව (3) නැගෙනහිර දිශාව

(32) රටාවේ හිස්තැනට ආ යුතු සංඛ්‍යාව ලියන්න.




(1) 4 (2) 5 (3) 6

(33) තරාදියක එක් පැත්තකට 1kg තරාදි පඩි 3ක් ද අනෙක් පැත්තට වට්ටක්කා කැලි දෙකක් ද, 200g පඩියක් ද දැමූ විට තරාදිය සමාන වේ. එසේ නම් වට්ටක්කා කැලි දෙකේ බර කොපමණ ද?

(1) 1200g (2) 2800g 1400g

(34) පාට පෑන් 84ක් තිබුණි. එයින් පෑන් 6 බැගින් සහ පෑන් 5 බැගින් කුඩා පැකට් 15ක් සාදන ලදී. පෑන් 6 බැගින් සෑදූ පැකට් ගණන කොපමණ ද?

(1) 6 (2) 8 (3) 9

(35) පහත දැක්වෙන්නේ පා පැදියක ඇති දැති රෝද යුගලයකි. එහි ලොකු දැති රෝදය එක් වටයක් කරකැවෙන විට කුඩා දැති රෝදය වට දෙකක් කැරකැවෙයි. ලොකු දැති රෝදය එක් වටයක් කරකැවීමේ දී පා පැදිය 3m ගමන් කරයි. ඒ අනුව පා පැදිය 21m ගමන් කරන විට කුඩා දැති රෝදය කැකැවෙන වාර ගණන කීය ද?



(1) 7 (2) 21 (3) 14

(36) [2] [5] [6] [9] මෙම කාඩ්පත් 4න් සෑදිය හැකි ඉලක්කම් දෙකේ සංඛ්‍යා ගණන කීය ද?

(1) 20 (2) 16 (3) 12

(37) [420] 2න් බෙදා 5න් ගුණ කළ විට ලැබෙන පිළිතුරේත් [420] 5න් බෙදා 2න් ගුණ කළ විට ලැබෙන පිළිතුරේත් වෙනස කොපමණ ද?

(1) 1050 (2) 882 (3) 168

(38) දින 31න් අවසන් වන මාසයක 3 වෙනිදා සිකුරාදා දවසකි. එම මාසයේ අවසාන දවසට පෙර දවස කුමක් ද?

(1) බදාදා (2) බ්‍රහස්පතින්දා (3) සිකුරාදා

(39) 4375 - 834 අගය විහිදුවා ලියා ඇති පිළිතුර තෝරන්න.

(1) 3000 + 500 + 40 + 1

(2) 4000 + 200 + 0 + 9

(3) 5000 + 500 + 40 + 1

(40) සීනි 6kg සහ තේ කොළ 2kg ක මිල රු.400 කි. සීනි 2kg ක මිල තේ කොළ 1kg කට සමාන වේ නම් සීනි 1kg ක මිල කීය ද?

(1) රු.40.00 (2) රු.80.00 (3) රු.60.00

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අංශයේ ප්‍රකාශනයකි.**

**5 වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව පෙරහුරු පරීක්ෂණය 2024**

**ප්‍රශ්න පත්‍ර අංක 01 - II පත්‍රය**

**විභාග අංකය : ..............................     කාලය පැය :- 1 යි මිනිත්තු 15 යි.**

(01) පහත දැක්වෙන ඡේදය කියවන්න.

ඇගේ ගම ගිංතොට ය. එය ගාලු පුරවරයට ඉතාම කිට්ටු සුන්දර ගම්මානයකි. මල්, පලතුරු, ගහකොළවලින් පිරුණු නිතර ම සිහිල් සුළඟ හමන මේ ගම ගැන අපූරු මතක සටහන් ඇයගේ සිහිනවල තිබිණි. හිමිදිරියේ ම අවදි වී ගේ අවට සිරියාව අත් විඳිමින් මේ පුංචි දැරිය ඒ අමුතු ම සිහින සිතින් මවා ගත්තා ය. ''සිබිල් නැන්දා'' හෙවත් සිබිල් වෙත්තසිංහ මැතිණිය එදා ඒ සිහින දුටු කුඩා දැරියයි. වයස අවුරුදු හයේ දී ඇයට ගමෙන් නගරයට එන්නට සිදු විය.

ඡේදය ඇසුරෙන් පිළිතුරු සපයන්න.

(i) ගිංතොට ගම්මානය පිහිටියේ කොහේ ද? ..........................................................................................

(ii) එම ගම්මානයේ පිරී තිබුණු දේවල් මොනවා ද? ...................................................................................

(iii) ඇයගේ සිහිනවල තිබුණේ කුමන දේවල් ද? ......................................................................................

(iv) මෙම දැරිය නිවස අවට සිරියාව අත් විඳින්නේ දවසේ කුමන වේලාවකදී ද? .......................................

(v) මෙම කුඩා දැරියගේ නම කුමක් ද? .................................................................................................

(vi) එක ම වචනයක එක ම පිල්ලම සිව් වතාවක් යෙදී ඇති වචනය කුමක් ද? ..........................................

(02) පහත සඳහන් එක් එක් වගන්තියෙහි උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි නම් ''✓'' ලකුණ ද වැරදි නම් ''✗'' ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.

(i) කුරුල්ලෝ හිමිදිරියේ ම කෑම සොයා පියඹා ගියහ. (     )

(ii) අම්මා මල්පැළවලට වතුර දැමුවේ ය. (     )

(iii) චඳුනි පුස්තකාලයට ගොස් පොත් කියවති. (     )

(iv) සේපාලිකා ගස්වල මල් බිමට වැටෙති. (     )

(03) ඒකවචන, අතීත කාල ස්ත්‍රී ලිංග ක්‍රියාපදය තෝරා යටින් ඉරක් අඳින්න.

(i) කරයි     (ii) කළෝ ය     (iii) කළා ය

(04) පහත එක් එක් ප්‍රශ්නයෙහි නිවැරදි අක්ෂර සහිත වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

(i) 1. විකාසනය     2. විකාශනය     3. විකාෂණය

(ii) 1. ගවේෂණ     2. ගවේශණ     3. ගවේශන

(05) පහත සඳහන් වාක්‍යය අතීත කාල ඒකවචනයට හරවා ලියන්න.

ළමයි දිනපතා පාසලට පැමිණෙති.

.....................................................................................................................................................

(06) පහත සඳහන් එක් එක් වචනයට ගැළපෙන සමාන පදයක් බැගින් ඉදිරියෙන් ඇති තිත් ඉරි මත ලියන්න.

(i) පාර : ..................................  (ii) උදෑසන : ..................................

(07) පහත දී ඇති වචන නිවැරදි ලෙස ගළපා අර්ථවත් වාක්‍යයක් ලියන්න.

ගුගුරවමින් / වැසි / අහස / ඇද / ධාරානිපාත / හැලිණි

.....................................................................................................................................................

(08) එක් එක් වගන්තිවල අදහසට ගැළපෙන ප්‍රස්තාව පිරුළ වරහන තුළින් තෝරා දී ඇති හිස්තැනෙහි ලියන්න.

(ඉගුරු දීලා මිරිස් ගත්තා වගේ / කළුවා මාරපන් ගියා වගේ / කටුස්සාගේ කරේ රත්තරන් බැන්දා වගේ / ආඬි හත්දෙනාගේ කැඳ හැළිය වගේ)

(i) නුසුදුස්සාට තනතුරු / වරප්‍රසාද දීමෙන් අහංකාර වීම

.....................................................................................................................................................


(ii) අනුන් රවටන්නට ගොස් තමන් රැවටීම


.....................................................................................................................................................

(09) සුදුසු විරාම ලකුණු යොදන්න.

| |
|---|
| ඔබ එන්නේ කොහි සිට දැයි අම්මා ආගන්තුකයාගෙන් ඇසුවා ය |

(10) එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය දී ඇති කොටුව තුළ ඉංග්‍රීසි අකුරෙන් ම ලියන්න.

(i) 

(ii) 

(11) පහත දී ඇති වචන නිවැරදි ව ගළපා අර්ථවත් වැකියක් බැගින් ලියන්න.

(i) Canteen / going / the / I / to/ am

.....................................................................................................................................................

(ii) can / see / in / What / you / picture/ the

.....................................................................................................................................................

(12) එක් එක් ඉංග්‍රීසි වචනයෙහි අර්ථය සිංහලෙන් ලියන්න.

(i) foods : .............................  (ii) play ground : ..............................

(13) 'නන්බි' යන දෙමළ වචනය සඳහා යෙදෙන සිංහල වචනය ලියන්න. ..........................................................

(14) පහත සඳහන් වාක්‍යය දෙමළෙන් කියන ආකාරය සිංහලෙන් ලියන්න.

ඔබේ වයස කීය ද? ..........................................................................................................................

(15) [7] [3] [6] [0] මෙම ඉලක්කම් භාවිත කර සෑදිය හැකි කුඩා ම සංඛ්‍යාව අකුරෙන් ලියන්න.

..........................................................................................................................

(16) හිස්තැන් පුරවන්න.

| සංඛ්‍යාව | ඉලක්කම | ඉලක්කම පිහිටි ස්ථානය | ඉලක්කමෙන් නිරූපිත අගය |
|---|---|---|---|
| 3486 | 4 | .................................... | |
| 8645 | 4 | | ............................................ |

(17) දී ඇති සංඛ්‍යා රටාවේ ඊළඟ සංඛ්‍යා දෙක ලියන්න.

39, 44, 49, 54, ........., .........

(18) 6 ට 4ක් එකතු කර ලැබෙන පිළිතුරෙන් 2ක් අඩු කළ විට ලැබෙන පිළිතුරට පසු සංඛ්‍යාව රෝම සංඛ්‍යාංකයෙන් ලියන්න.

..........................................................................................................................


(19) පහත දැක්වෙන සංඛ්‍යා තුන ආරෝහණ පිළිවෙළට නැවත ලියන්න.

3508, 3058, 3805 - ..........................................................................................................

(20) කමිසයකට බොත්තම් 8ක් බැගින් අල්ලා කමිස 410ක් මසා ඇත. කමිසවලට අල්ලන ලද මුළු බොත්තම් ගණන කීය ද? ..........................................................................................................

(21) පාසලක සිටින සිසුන්ට තෑගි ලෙස ලැබුණු අභ්‍යාස පොත් 420 න් 1/3ක් 5 ශ්‍රේණියේ සිසුන්ට බෙදා දෙන ලදී. 5 ශ්‍රේණියේ සිසුන්ට බෙදා දුන් පොත් වලින් අඩක් කොටු රූල් පොත් ය. 5 ශ්‍රේණියේ සිසුන්ට ලැබුණු කොටු රූල් පොත් ගණන කීය ද? ..........................................................................................................

(22) පහත රූප අතරින් සමමිතික රේඛා 3ක් පමණක් ඇති හැඩතලයේ නම ලියන්න.




..........................................................

(23) පාසල නිමවන වේලාව පස්වරු එක පසු වී මිනිත්තු තිහ, පැය විසිහතරේ ඔරලෝසුවේ දැක්වෙන (සම්මත) ආකාරයට පහත කොටුව තුළ ලියන්න.


[ ............:............ ]

(24) පහත රූපයේ අඳුරු කර ඇති කොටස, මුළු රූපයෙන් 3/4ක් වීමට තව කොටු කීයක් අඳුරු කළ යුතු ද?

..........................................



(25) පහත දී ඇති සටහන ඇසුරෙන් පිළිතුරු සපයන්න.




(i) A නගරයේ සිට B නගරය හරහා C නගරයට ගමන් කරන්නෙකු යා යුතු දුර කොපමණ ද? ..........................................

(ii) A හා B නගර අතර ඇති දුර මෙන් 3 ගුණයක දුරක් ඇත්තේ කුමන නගර අතර ද? ..............................................................

(26) 2$l$ ක භාජනයකට ජලය පිරවීම සඳහා 100m$l$ භාජනයකින් කී වාරයක් ජලය දැමිය යුතු ද? .........................

(27) වගුව බලා පිළිතුරු සපයන්න.

| පාර්සලය | සිතූ බර (නිමානය කළ බර) | සැබෑ බර |
|---|---|---|
| A | 1Kg 250g | 975g |

A පාර්සලයේ නිමානය කළ බර හා සැබෑ බර අතර වෙනස කොපමණ ද? ..................................................

(28) මිල දර්ශනය බලා පිළිතුරු සපයන්න.


| ද්‍රව්‍යය | 1 Kg ක මිල | |
|---|---|---|
| | රුපියල් | සත |
| සීනි | 280 | 00 |
| පරිප්පු | 320 | 00 |
| සහල් | 210 | 00 |

(i) සහල් 1Kg, පරිප්පු 250g සහ සීනි 500gක් සඳහා ගෙවිය යුතු මුදල කීය ද? ..........................................................................

(ii) ඉහත ද්‍රව්‍ය මිල දී ගැනීම සඳහා රුපියල් 500 නෝට්ටුවක් මුදලාලිට දුන් විට ලැබෙන ඉතුරු මුදල කීය ද? .........................

(29) පාසලට පැමිණීම සඳහා එක් පන්තියක සිසුන් භාවිත කරන වාහන පිළිබඳ තොරතුරු පහත තීර ප්‍රස්තාරයෙන් දැක්වේ.

සිසුන් පාසලට පැමිණෙන ආකාරය




ප්‍රස්තාරය බලා පිළිතුරු ලියන්න.

(1) වැඩි ම සිසුන් සංඛ්‍යාවක් පැමිණෙන්නේ කුමන වාහනයෙන් ද? ...........................................................

(2) වෑන් රථවලින් පැමිණෙන සිසුන්ට වඩා බස්රථවලින් පැමිණෙන සිසුන්ගේ සංඛ්‍යාව කීය ද? ...........

- **අංක 30 සිට 59 තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුරු දී ඇති පිළිතුරු අතුරෙන් තෝරා යටින් ඉරක් අඳින්න.**

(30) පෙති 4කින් යුක්ත මලකි.

(1) නා මල (2) සේපාලිකා මල (3) සමන්පිච්ච මල

(31) කඳෙහි මෙන්ම අතුවල ද ගෙඩි හට ගන්නා ශාකයකි.

(1) දෙල් (2) කොස් (3) උගුරැස්ස

(32) කාලගුණික වෙනස්කම් හඟවන සතෙකි.

(1) වැහිලිහිණියා  (2) පැණි කුරුල්ලා  (3) කැරලා

(33) ඉක්මනින් පැළ හට ගන්නා බීජයකි.

(1) නමිනං  (2) ජම්බු  (3) මුං

(34) සූර්ය නමස්කාර ක්‍රියාකාරකම්වල ඇති ක්‍රියාකාරකම් ගණන,

(1) 13 කි  (2) 10 කි  (3) 12 කි

(35) තවාන්වල දැමීම හා බීජ ඉසීම මගින් පැළ ලබා ගන්නා ශාකයකි.

(1) ගොයම්  (2) බතල  (3) රඹුටන්

(36) ජලය සම්බන්ධව පහත කුමන ප්‍රකාශය නිවැරදි ද?

(1) ජලය අසීමිත සම්පතකි.

(2) ගංගා, ඇළ, දොළවල කරදිය ජලය ඇත.

(3) ජලයට නිශ්චිත හැඩයක් නොමැති අතර එය අඩංගු භාජනයේ හැඩය ගනී.

(37) පහත දැක්වෙන්නේ දණ්ඩ චුම්බක 2 කි. මෙම දණ්ඩ චුම්බක දෙක එකිනෙකට ළං කිරීමේදී ඒවා,




(1) විකර්ෂණය වේ.
(2) ආකර්ෂණය වේ.
(3) කිසිවක් සිදුනොවේ.

(38) ජනප්‍රිය ගෘහස්ථ ජන ක්‍රීඩාවකි.

(1) පනා හැංගීම  (2) මේවර කෙළිය  (iii) ඔළිඳ කෙළිය


(39) කාබනික පොහොර සකසා ගැනීමේ දී පොලිතින් භාවිත නොකරයි. එයට හේතුව වන්නේ,

(1) පොලිතින් ලිස්සන සුළු නිසා ය

(2) පොලිතින් දිරාපත් නොවන නිසා ය

(3) පොලිතින් මිල අධික නිසා ය

(40) පහත බඳුනේ ඇති ජලයට කිසියම් දියර වර්ගයක් දමා ඇත. එම දියරය විය හැක්කේ,




(1) විනාකිරි

(2) පොල්තෙල්

(3) ලුණු දියර

(41) ''ස්වයං පෝෂිත රටක ඉර හඳ පවතින තෙක් ධර්මය ආරක්ෂා කරමින් මුළු මහත් ජනතාව ම වැජඹේවා'' යන අදහසින් සංකේතවත් වන්නේ,

(1) ජාතික කොඩියෙනි

(2) බෞද්ධ කොඩියෙනි

(3) රාජ්‍ය ලාංඡනයෙනි

(42) ශ්‍රී ලංකාවේ ජාතික සංකේතයක් නොවන්නේ මින් කුමක් ද?

(1) වලි කුකුළා (2) නා ගස (3) පොල් ගස

(43) කෘමි සතුන් යුගලයක් නොවන්නේ මින් කුමන පිළිතුර ද?

(1) දිමියා, කඩියා

(2) උකුණා, මකුළුවා

(3) කුඹියා, මදුරුවා


(44) පෝරු ලෑල්ල, අතංගුව, කිණිහිරය යන උපකරණ අවශ්‍ය වන වෘත්තීන් පිළිවෙළින් සඳහන් වන පිළිතුර තෝරන්න.

(1) කෘෂි කර්මාන්තය, කම්මල් කර්මාන්තය, ධීවර කර්මාන්තය

(2) කෘෂි කර්මාන්තය, ධීවර කර්මාන්තය, පෙදරේරු කර්මාන්තය

(3) කෘෂි කර්මාන්තය, ධීවර කර්මාන්තය, කම්මල් කර්මාන්තය

(45) පහත රූපයේ සඳහන් උපකරණයේ කැරකැවීම කෙරෙහි බලපාන කරුණක් විය හැක්කේ,



(1) සුළඟේ වේගය යි

(2) ජල පහරේ වේගය යි

(3) ජලයේ ඇති පිරිසිදු බව යි

(46) වෙළෙඳ පොළේ අලෙවිය සඳහා ඇති බීම වර්ග මිල දී ගැනීමේ දී අප විසින් තෝරා ගැනීමට වඩාත් සුදුසු වන්නේ කුමන වර්ණ සංකේතය සහිත බීම වර්ග ද?

(1) කහ වර්ණය (2) කොළ වර්ණය (3) රතු වර්ණය

(47) ඇස් පෙනීමේ දුර්වලතාවයකින් පෙළෙන අයෙකු නිරන්තරයෙන් තම ආහාර වේල් සඳහා එකතු කර ගත යුත්තේ,

(1) පලතුරු හා තද කොළ පැහැති පලා වර්ග යි

(2) පිෂ්ඨය සහිත අල වර්ග යි

(3) මස්, මාළු හා මේදය අඩංගු ආහාර යි

(48) මොනවද මුත්තේ මොකද කරන්නේ? මොකටද ඔබ ඔය බිම හාරන්නේ ........................ ගීතයෙන් අපට ගත හැකි ආදර්ශය කුමක් ද?

(1) ගස් සිටුවීමේ වැදගත්කම

(2) පලතුරු ආහාරයට ගැනීමේ වැදගත්කම

(3) බඳුන් ගත වගාවේ වැදගත්කම

(49) ඔබේ ගෙවත්ත පරිසර හිතකාමී, පිරිසිදු ස්ථානයක් බවට පත් කර ගැනීමට ගත හැකි සුදුසු ම ක්‍රියාමාර්ගය මින් කුමක් ද?

(1) අපද්‍රව්‍ය ගෙවත්තේ කෙළවරකට රැස් කිරීම

(2) සියලු අපද්‍රව්‍ය පුලුස්සා දැමීම

(3) අපද්‍රව්‍ය වර්ග කර ක්‍රමවත් ව බැහැර කිරීම

(50) වඩු කර්මාන්තයේ දී භාවිත කරන උපකරණය මින් කුමක් ද?

(1) 


(2) 

(3) 

(51) මාලිමාවක දර්ශකය (රතු ඊ හිස) හැම විට ම යොමු වන්නේ,

(1) උතුරු දිශාවට ය (2) දකුණු දිශාවට ය (3) ඊසාන දිශාවට ය

(52) ක්‍රීඩා පිටියේ පහත ආකාරයට කොටු සැලැස්මක් යොදා ගනිමින් කරනු ලබන ක්‍රීඩාව හඳුන්වන්නේ,




(1) බට්ටා පැනීමේ ක්‍රීඩාව

(2) පනා හැංගීමේ ක්‍රීඩාව

(3) ඔලිඳ කෙළිය

(53) ඓතිහාසික වටිනාකමක් ඇති ස්ථාන, ඓතිහාසික වටිනාකමකින් යුත් ශාක සංරක්ෂණය කිරීමේ වගකීම ඇත්තේ,

(1) පුරා විද්‍යා දෙපාර්තමේන්තුවට

(2) වැඩිහිටියන්ට

(3) ශ්‍රී ලාංකික පුරවැසියන් සියලු දෙනාට

(54) ''අද දින සවස් කාලයේ දකුණු හා මධ්‍යම පළාත්වලට අධික වැසි ඇද හැලේ'' යැයි කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව ප්‍රකාශ කළේ ය. ඒ අනුව එම පළාත් දෙකට අයත් දිස්ත්‍රික්ක නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) හම්බන්තොට, මාතලේ (2) මාතර, රත්නපුර (3) කොළඹ, කෑගල්ල

(55) පහත රූපයෙන් අදහස් වන්නේ කුමක් ද?



(1) රෙදි කුඩයට දමන්න

(2) කසළ බඳුනට දමන්න

(3) රථ වාහන නවත්වන ස්ථානය

(56) පා පැදියක පසුපස රෝදයට සම්බන්ධ කර ඇති දැති රෝද යුගලයක් පහත රූපයේ දැක්වේ.



මේ සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශය නිවැරදි ද?

(1) කුඩා දැති රෝදය එක් වටයක් කැරකැවෙන විට විශාල දැති රෝදය වට කිහිපයක් කැරකේ

(2) විශාල දැති රෝදය එක් වටයක් කැරකැවෙන විට කුඩා දැති රෝදය වට කිහිපයක් කැර කැවේ

(3) විශාල දැති රෝදය හා කුඩා දැති රෝදය එක සමාන වට ගණනක් කැරකැවේ

(57) අප තුළ නිරන්තරයෙන් තිබිය යුත්තේ,

(1) සහනශීලී චර්යා

(2) යටහත් චර්යා

(3) ආක්‍රමණශීලී චර්යා


(58) තම ප්‍රදේශයේ බෝවන රෝගයක් ව්‍යාප්ත වන අවස්ථාවක ඒ පිළිබඳව දැනුම් දිය යුත්තේ කාට ද?

(1) ග්‍රාම සේවක මහතාට ය

(2) මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමාට ය

(3) පොලිස් නිලධාරී මහතාට ය

(59) පහත දැක්වෙන්නේ වියළි කෝෂයකට වයර් සම්බන්ධ කර ගනිමින් බල්බයක් දැල්වීමට උත්සාහ කළ අවස්ථාවකි. මෙහිදී බල්බය,



(1) දැල්වේ

(2) නොදැල්වේ

(3) කිව නොහැක

(60) සුදාරක, සහන් හා දසුන් සරුංගලයක් සාදා එය අසල පිට්ටනියකට ගොස් එය උඩ යැවීමට සූදානම් විය. ඊළඟට සිදුවිය හැකි දේ වැකි 3කින් ලියන්න. එහිදී එක් වැකියකට අවම වචන 5ක් වත් විය යුතු අතර නිවැරදි උක්ත ආඛ්‍යාත සම්බන්ධය කෙරෙහි සැලකිලිමත් වන්න.

1. ..............................................................................................................................................

..............................................................................................................................................

2. ..............................................................................................................................................

..............................................................................................................................................

3. ..............................................................................................................................................

..............................................................................................................................................

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අංශයේ ප්‍රකාශනයකි.**

**5 වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව පෙරහුරු පරීක්ෂණය 2024**

**පිළිතුරු**

## ප්‍රශ්න පත්‍ර අංක 01 - I පත්‍රය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| (01) 2 | (02) 3 | (03) 1 | (04) 3 | (05) 1 | (06) 3 | (07) 3 | (08) 1 | (09) 1 | (10) 1 |
| (11) 3 | (12) 3 | (13) 3 | (14) 2 | (15) 2 | (16) 2 | (17) 1 | (18) 1 | (19) 1 | (20) 3 |
| (21) 2 | (22) 3 | (23) 2 | (24) 3 | (25) 3 | (26) 1 | (27) 1 | (28) 3 | (29) 1 | (30) 2 |
| (31) 2 | (32) 3 | (33) 2 | (34) 3 | (35) 3 | (36) 3 | (37) 2 | (38) 2 | (39) 1 | (40) 1 |

## ප්‍රශ්න පත්‍ර අංක 01 - II පත්‍රය

(01) (i) ගාලු පුරවරයට ඉතාම කිට්ටුව (ii) මල්, පලතුරු, ගහකොළ (iii) ගම ගැන අපූරු මතක සටහන් (iv) හිමිදිරියේ (v) සිබිල් වෙත්තසිංහ (vi) හිමිදිරියේ (02) (i) (✓) (ii) (×) (iii) (×) (iv) (×) (03) (iii) කළා ය. (04) (i) (2) විකාශනය (ii) (1) ගවේෂණ (05) ළමයා දිනපතා පාසලට පැමිණියේ ය. (06) (i) මාර්ගය (ii) හිමිදිරිය (07) අහස ගුගුරවමින් ධාරානිපාත වැසි ඇද හැලිණි. (08) (i) කටුස්සාගේ කරේ රත්තරන් බැන්දා වගේ (ii) ආඬි හත්දෙනාගේ කැඳ හැළිය වගේ (09) ''ඔබ එන්නේ කොහි සිට ද?'' යි අම්මා ආගන්තුකයාගෙන් ඇසුවා ය. (10) (i)

| | | | | | |
|---|---|---|---|---|---|
| R | a | b | b | i | t |
| r | a | b | b | i | t |
| R | A | B | B | I | T |

(ii)

| | | | | | |
|---|---|---|---|---|---|
| C | l | o | u | d | s |
| c | l | o | u | d | s |
| C | L | O | U | D | S |

(11) (i) I am going to the canteen (ii) What can you see in the picture? (12) (i) ආහාර (ii) ක්‍රීඩාපිටිය (13) මිතුරිය/යෙහෙළිය (14) උංගල්/උංගළුක්කු වයදු එත්තනෙ? (15) තුන් දහස් හැට හත (16) සියයස්ථානය, 40 (17) 59, 64 (18) (viii) (19) 3058, 3508, 3805 (20) 3280 යි. (21) 70 යි. (22) ත්‍රිකෝණය (23) 13 : 30 (24) කොටු 6ක්. (25) (i) 80km 320m (ii) B සහ C අතර (26) වාර 20ක් (27) 275g යි. (28) (i) රුපියල් 430 යි. (ii) රුපියල් 70 යි. (29) (i) බස් රථයෙන් (ii) 7 යි. (30) 1 (31) 2 (32) 1 (33) 3 (34) 2 (35) 1 (36) 3 (37) 2 (38) 3 (39) 2 (40) 2 (41) 3 (42) 3 (43) 2 (44) 3 (45) 2 (46) 2 (47) 1 (48) 1 (49) 3 (50) 2 (51) 1(52) 1 (53) 3 (54) 1 (55) 2 (56) 2 (57) 1 (58) 2 (59) 2 (60) නිවැරදි උක්ත ආඛ්‍යාත සම්බන්ධය සහිතව එක් වැකියකට අවම වචන 5ක් වනසේ වැකි 3ක් දී ඇති උපදෙස් පරිදි ලියා ඇත්නම් ලකුණු (2×3)

අංක 1-14 = ලකුණු 27

අංක 15-29 = ලකුණු 36

අංක 30-59 = ලකුණු 30

අංක 60 = ලකුණු 06

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අංශයේ ප්‍රකාශනයකි.**


**5 වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව පෙරහුරු පරීක්ෂණය 2024**

**ප්‍රශ්න පත්‍ර අංක 02 - I පත්‍රය**

**විභාග අංකය : .........................................  කාලය පැය :- 1යි.**

- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල නිවැරදි තෝරා යටින් ඉරක් අඳින්න.

(01) පහත රූපය නිරීක්ෂණය කරන්න. රූපයට ගැළපෙන නිවැරදි ප්‍රකාශය තෝරන්න.





(i) ගැහැණු ළමයින් දෙදෙනෙකි


(ii) පිරිමි ළමයින් දෙදෙනෙකි


(iii) ගැහැනු ළමයෙකු හා පිරිමි ළමයෙකි.


- කොටුව තුළ ඇති ද්‍රව්‍ය ඇතුළත් කාණ්ඩයට එක් කළ හැකි දේ ඇතුළත් පිළිතුර තෝරන්න.


(02) 


(i) 


(ii) 

(iii) 

(03) 


(i) 


(ii) 


(iii) 

- අංක 4 සහ 5 යන ප්‍රශ්න සඳහා මුලින් දී ඇති චිත්‍රයේ "?" ලකුණ ඇති ස්ථානයේ තිබිය හැකි දෙයක් සඳහන් පිළිතුර තෝරන්න.


(04) 



(i) 


(ii) 

(iii) 

(05) 


(i) 

(ii) 

(iii) 

- පහත පිරුළුවල අදහස හොඳින් විස්තර කරන පිළිතුර තෝරන්න.

(06) පාළු ගෙයි වළං බිඳිනවා වගේ
   (i) වගකිව යුත්තෙකු නැති තැන අනවශ්‍ය ලෙස වැඩ කිරීම
   (ii) සමහරු නෙතේරෙන වැඩ කිරීමට ඉගොස් අමාරුවේ වැටීම
   (iii) තේරුමක් තිබුණත් නොතේරෙන වැඩ කිරීම


(07) කිරි මුහුදට හඳ පැවූවා වගෙයි
   (i) ලස්සන දෙයකට අවලස්සන දෙයක් එකතු වීම
   (ii) අවලස්සන තැනක් ලස්සන වීම
   (iii) ලස්සන තැනක් තවත් ලස්සන වීම

- කවිය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

බකමූණෝ පියාඹති
අනික් කුරුල්ලෝ නිදති
බෝ අතුවල එල්ලී ගෙන
මා වවුලෝ කෑ ගසති

(08) කවියෙන් කියවෙන ක්‍රියාවලිය පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
   (i) පියෑඹීම, කෑ ගැසීම, නිදා ගැනීම, එල්ලීම
   (ii) පියෑඹීම, නිදා ගැනීම, එල්ලීම, කෑ ගැසීම
   (iii) පියෑඹීම, නිදා ගැනීම, කෑ ගැසීම, එල්ලීම

(09) සිද්ධියට අදාළ රූප 5ක් දී ඇත. සිද්ධිය පිළිවෙළින් ගළපන්න.




(i) AEBCD (ii) BDEAC (iii) CAEBD

- එකිනෙක තරගයට
පැරදුනොත් සෙල්ලම් කොට
සතුට මිස නොසතුට
නොදක්වමි මම මිතුරු පිරිසට

(10) ඉහත කවියෙන් කියවෙන්නේ,
   (i) තරග තෝරාගෙන සෙල්ලම් කළ යුතු බව
   (ii) ජය පරාජය සම සමව විඳ ගන්නා බවයි
   (iii) පරදින්නේ නම් සෙල්ලම් නොකළ යුතු බවයි.

(11) පහත දී ඇති කොටු දැලෙහි හරහට හා පහළට සෑම තීරයක ම හා පේළියක ම එකතුව එක සමාන උත්තරය ලැබෙන ආකාරයට ඉලක්කම් යෙදිය යුතු ය. ( ඒ අනුව පිළිවෙළින් A, B, C කොටු සඳහා යෙදිය යුතු ඉලක්කම් මොනවා ද?


| | | |
|---|---|---|
| **14** | **19** | **A** |
| **13** | **B** | **17** |
| **C** | **11** | **16** |

(i) 18, 12, 15

(ii) 12, 18, 15

(iii) 12, 15, 18

(12) දී ඇති වෘත්තයේ ත්‍රිකෝණාකාර හැඩයක් ලබා ගැනීම සඳහා නැමිය යුතු හෝ ඉවත් කළ යුතු කොටස් ගණන කීය ද?




(i) 2කි

(ii) 3කි


(iii) 4කි

(13) දී ඇති හැඩතල අතුරෙන් තුනක් එකතු කර සෘජුකෝණාස්‍රයක් සැදිය හැකි ය. ඒ හැඩතල මොනවා ද?




(i) A,B,C (ii) A,D,B (iii) A,C,D

(14) පහත දී ඇති රූපය ඝනකයක් වන සේ සකස් කිරීමට තවත් එවැනි ඝනක කීයක් අවශ්‍ය ද?



(i) 27

(ii) 25

(iii) 17

(15) A හා B නගර දෙක අතර 60km කි. B සිට A දක්වා පැයට කිලෝමීටර 5ක වේගයෙන් යන පා පැදියක් සහ A සිට B දක්වා පැයට කිලෝමීටර 10ක වේගයෙන් යන තවත් පා පැදියකි. මොවුන් දෙදෙනා පෙ.ව 6.00ට ගමක ආරම්භ කළේ නම් දෙදෙනා එකිනෙකා හමු වන වේලාව කීය ද?

(i) පෙ.ව 8.00 (ii) පෙ.ව 9.00 (iii) පෙ.ව 10.00

(16) දෙදෙනා එකිනෙකා හමු වන්නේ කීවෙනි කිලෝමීටර කණුව අසල දී ද?

(i) 40km කණුව අසල දී (ii) 35km කණුව අසල දී (iii) 45km කණුව අසල දී

(17) දී ඇති ගැටලුවේ කොටු කර ඇති සංඛ්‍යාවලට ගැළපෙන සංඛ්‍යා සහිත පිළිතුර තෝරන්න.

$30 + \boxed{14 + 16 \div 2} + 17 = 69$

(i) $28 \div 2 - 1$ (ii) $30 \div 3 + 12$ (iii) $3 \times 5 - 0$

(18) $12 + \boxed{8 + 6 \div 2} + 27 = 50$

(i) $15 \div 3 + 6$ (ii) $28 \div 2 \div 2$ (iii) $32 \div 2 \div 3$


(19) පහත සඳහන් ප්‍රශ්නයට වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න

කහව ගමේ සිටින සියලු ම උපාසක මහතුන් සුදු සරම හා සුදු කමිසය අඳියි. කපටි රාළ ගමේ සිටින හොරෙකු වන අතර ඔහු සුදු සරම හා සුදු කමිසය අඳියි.

ඒ අනුව නන්දිපාල උපාසක මහතෙකු නොවේ.

(i) වැරදි ය. (ii) නිවැරදි යි. (iii) කිව නොහැකි ය.

(20) පහත රූපයේ අඳුරු කර නොමැති කොටස මුළු රූපයෙන් භාගයක් ලෙස නිවැරදි ව දැක්වෙන පිළිතුර යටින් ඉරක් අඳින්න.



(i) $\frac{1}{4}$

(ii) $\frac{1}{12}$

(iii) $\frac{3}{4}$

(21) පහත සඳහන් සිදුවීම් සඳහා දී ඇති හේතුවලින් වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.


ගස යට වැසි දෙකක් වන්නේ,

(i) ගස යට වතුර රැඳෙන නිසා


(ii) ගස යටට වැසි දෙකක් වසින නිසා


(iii) ගස හා වැස්සෙන් යන දෙකෙන් ම වතුර වැටෙන නිසා

(22) පහත දැක්වෙන රූපය කඩදාසි තීරුවක් එක වරක් නවා කඩ ඉරි දිගේ දෙකෙළවර කපා නැවත දිග හරින ලද එකකි. එය සෑදීමට යොදාගත් කඩදාසි තීරුව සොයන්න.




(i) 

(ii) 

(iii) 


(23) පහත දැක්වෙන්නේ එකිනෙකට සම්බන්ධ වළලු කිහිපයකි. එම කැබලි දෙක බැගින් සිටින සේ කපා සකස් කිරීමට කැපිය යුතු හා පෑස්සිය යුතු අවම වාර ගණන කීය ද?





(i) කැපීම් 5, පෑස්සීම් 5 (ii) කැපීම් 3, පෑස්සීම් 3 (iii) කැපීම් 4, පෑස්සීම් 4

(24) පහත රූපය ඉහළ සිට බැලූ විට පෙනෙන ආකාරය වන්නේ,



(i) 

(ii) 

(iii) 


(25) පහත කවිය කියවා 25-1 හා 2 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




වැඩිහිටි ගැබිනි මව් වැනි අපහසු අයට
දීමට තම අසුන පුළුවන් සැම විටම
කරදර නොකර සිටගෙන ඉන්නා අයට
හුරුවෙමු පුරුදු වෙමු හොඳ දේ කිරීමට

(1) මෙම කවියේ සමස්ත අදහසින් පවසන දේ වන්නේ,
(i) හොඳ දේ කිරීමට හුරු පුරුදු වීම ය. (ii) වැඩිහිටි අයට සැළකීම ය.
(iii) හොඳ දේ කිරීමට හුරු පුරුදු නොවීම ය.

(2) මෙහි සඳහන් කළයුතු හොඳ දේවල් තෝරන්න.
(i) ගැබිනි මව්වරුන්ට හා අපහසු අයට අසුන දීම ය.
(ii) වැඩිහිට, ගැබිනි අයට අසුන දීම හා සිටගෙන සිටින අයට කරදර නොකිරීම ය.
(iii) වැඩිහිටි ගැබිනි අයට අසුන නොදීම ය.




(26) රටාව අනුව ඊළඟට ආ යුතු රූපය තෝරන්න.




(i)

(ii)

(iii)


(27)


ඉහත රූපය අනුව නිවැරදි පිළිතුර තෝරන්න.

(i)

(ii)

(iii)


■ දී ඇති සටහන බලා පහත 28, 29 ප්‍රශ්නවලට පිළිතුරු තෝරන්න.







(28)

හි අගය වනුයේ,

(i) 1 6 5 4 (ii) 6 1 5 0 (iii) 5 0 1 6

(29) 4 A B 3 =

(i)

(ii)

(iii)


■ අංක 30 හා 31 ප්‍රශ්නවල වැරදි අදහස අඩංගු පිළිතුර තෝරන්න.

(30) (i) වවුලා පක්ෂියෙකි. ඌ පැටවු මගින් තම වර්ගයා බෝ කරයි.

(ii) ගවයා ක්ෂීරපායී සත්ත්වයෙකි. ඌ තණකොළ කයි.

(iii) චන්ද්‍රයා පෘථිවියේ උප ග්‍රහයෙකි. එයට සූර්යයාගෙන් ආලෝකය ලැබෙයි.

(31) (i) නුවර වැව තිබෙන්නේ අනුරාධපුරයේ ය.

(ii) ගාලු මුවදොර තිබෙන්නේ කොළඹ ය.

(iii) ශ්‍රී ලංකාවේ අගනුවර කොළඹ ය.

(32) සදීප් වෘත්තාකාර ඔරලෝසු මුහුණතක ඇති අංක හරහා සමමිතික අක්ෂ අඳින ලදී. ඔහු ඇඳින ලද සමමිතික අක්ෂ ගණන කීය ද?

(i) 12 (ii) 24 (iii) 6

(33) තිලක් එක් ගණනක් සාදන විට මලිත් ගණන් 3ක් සාදයි. මලිත් එක් ගණනක් සාදන විට චරිත් ගණන් දෙකක් සාදයි. තිදෙනා ම ගණන් 100ක් සාදන විට මලින් සෑදූ ගණන් ප්‍රමාණය කොපමණ ද?

(i) 30 කි. (ii) 60 කි. (iii) 50කි.

(34) බසයක ගැහැනු මගීන් මෙන් දෙගුණයක් පිරිමි මගින් සිටියහ. බස් නැවතුමෙන් බසය නතර කළ විට ගැහැනු මගීන් අඩක් බැස ගියහ. දැන් බසය තුළ ගැහැනු මගීන් මෙන් හතර ගුණයක් පිරිමි මගීන් සිටිති. බසය තුළ පිරිමි 40සිටී නම් මුලින් සිටි ගැහැනු මගීන් සංඛ්‍යාව කීය ද?

(i) 30 (ii) 10 (iii) 20

| | | | |
|---|---|---|---|
| පරිප්පු | 1kg + සීනි 2kg | = | රු. 1040 |
| සීනි | 1kg + සහල් 3kg | = | රු. 990 |
| සීනි | 3kg + පරිප්පු 1kg | = | රු. 1400 |

(35) ඉහත විස්තරය අනුව පරිප්පු 2kg හා සීනි 3kg ක මිල කීය ද?

(i) රු.1556.00 (ii) රු.1720.00 (iii) රු.1750.00

(36) ඉහත ද්‍රව්‍ය සියල්ලෙන් ම 1kg බැගින් ගත්තේ නම් ගෙවිය යුතු මුදල කීය ද?

(i) රු. 1120.00 (ii) රු.1250.00 (iii) රු.890.00

(37) සමන් පවන්ගේ පියා ය. සයුරිගේ පියා සමන් ය. සමන්ගේ බිරිද ශ්‍රියා ය. ශ්‍රියා සහ සයුරිගේ නෑකම වනුයේ,

(i) ආච්චි සහ මිණිපිරි (ii) මව සහ දුව (iii) නැන්දා සහ දුව

(38) දී ඇති අකුරු කිසියම් ලක්ෂණයක් අනුව තැබිය හැකි පිළිතුර වන්නේ,

| | | | |
|---|---|---|---|
| අ | ද | ර | ග |
| න | ප | ව | ල |

(i) ග, ප, න (ii) අ, ද, ර (iii) ව, ර, ල

කවීෂ හා සෙත්මික ළඟ ඇති මුදල රු.180කි. කවීෂ සෙත්මිකට රුපියල් 2.00 දුන්විට දෙදෙනා ළඟ ඇති මුදල සමාන වන්නේ ය. මේ අනුව 39 හා 40 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(39) සෙත්මික ළඟ තිබූ මුදල කීය ද?

(i) රු.110.0 (ii) රු. 92.00 (iii) රු. 88.00

(40) කවීෂ ළඟ තිබූ මුදල කීය ද?

(i) රු. 92.00 (ii) රු. 88.00 (iii) රු. 90.00

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අංශයේ ප්‍රකාශනයකි.**

**5 වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව පෙරහුරු පරීක්ෂණය 2024**

**ප්‍රශ්න පත්‍ර අංක 02 - II පත්‍රය**

**විභාග අංකය : ..............................  කාලය පැය :- 1 යි මිනිත්තු 15 යි.**

(01) පහත සඳහන් ඡේදය කියවන්න.

පාසල් වත්ත අද්දරින් ගලා බස්නා දිය කඳුරක් වෙයි. මේ දිය කඳුරට දිය බීමට මුවෝ පැමිණෙති. එතැන හැඳින්වෙන්නේ දියමංකඩ නමින් ය. මේ දියමංකඩ අසල හත් අට දෙනෙකුගෙන් යුත් මුව රංචුවක් වූහ. දිය බී මුවෝ සැනසිල්ලේ ගිමන් හරින්නවුන් පරිද්දෙන් බලා සිටියහ. ඉඳහිට ඔවුහු නාද කරති.

ඒ ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) මුවෝ දිය බීමට පැමිණෙන තැන හැඳින් වූ නම කුමක් ද? ..........................................................

(ii) මෙහි සඳහන් උපමාවක් තෝරා ලියන්න. ..........................................................

(iii) ප්‍රාණවාචී බහුවචන උක්ත පදයක් ලියන්න. ..........................................................

(iv) ''දිය බීමට මුවෝ පැමිණෙති'' යන වැකිය ඒක වචන අතීත කාලයට හරවා ලියන්න.

..........................................................

(v) ''සමූහයක්'' යන්න දැක්වෙන පදය ලියන්න. ..........................................................

(vi) දිය කඳුර ගලා යන්නේ කුමන අසලින් ද? ..........................................................

(02) හිස්තැනට සුදුසු අක්ෂරය යටින් ඉරක් අඳින්න.

(i) සමස් ....... (ත/ථ)  (ii) සෙව ......... ල්ල (ණැ/නැ)

(03) ඉරි ඇඳි පදවලට සමාන පදය යොදා වැකිය නැවත ලියන්න.

<u>පොත්</u> අපේ <u>ඇස්</u> වැනි ය.

..........................................................

(04) නිවැරදිව පද බෙදා වගන්තිය නැවත ලියන්න.

උගතමනාශිල්පයමයිමතුරුකෙනා

..........................................................

(05) සුදුසු විරාම ලකුණු යොදන්න.

ඇස් මහින්ද හිමි නිදහසේ මන්ත්‍රය රචනා කළේය.

(06) පහත වැකිය ලේඛන වහරට හරවන්න.

ගෙදර ගිහින් තාත්තා පත්තරය බැලුවා.

(07) පහත සඳහන් වන ඉඟි වැකියේ අර්ථය ලියන්න.

අකුරක් නැර

.......................................................................................................................

(08) අදූරදර්ශී උපදෙස් දීම යන්නට ගැළපෙන ප්‍රස්තාව පිරුළ කුමක් ද?

.......................................................................................................................

(09) හිස්තැන්වලට ගැළපෙන නිවැරදි වචනය තෝරන්න.

(i) නැන්දා රසවත් ආහාර ................................................ (සැදුවේ ය. / සෑදුවා ය.)

(ii) මුවදෙන පැටවා සමග දියට ...................................... (බසියි. / බසිති.)

(iii) (මම / මා) ............................ පරිසරයට ආදරය කරමි.

(iv) ඉදුණු අඹ ගෙඩි බිමට ................................................. (වැටුණේ ය. / වැටුණ හ.)

(10) එක් එක් ඉංග්‍රීසි වචනය සඳහා යෙදෙන සිංහල වචනය ලියන්න.


(i) Kichen ..............................  (ii) Mosquito ..............................

(11) පහත දී ඇති වචන නිවැරදිව ගළපා අර්ථවත් වැකියක් සාදන්න.

on / table / It / the / is

.........................................................................................

(12) රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය ලියන්න.



......................................

(13) එනක්කු අප්පම් වේණ්ඩුම් යන දෙමළ වැකියේ අර්ථය සිංහලෙන් ලියන්න.

.......................................................................................................................

(14) පහත වාක්‍ය දෙමළෙන් කියන ආකාරය සිංහලෙන් ලියන්න.

වෙලාව එකයි. .........................................................................................

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

(15) (i) සංඛ්‍යා නාමය ලියන්න.

19 005 ...............................................................................

(ii) අසූ හත් දහස් තිස් අට යන සංඛ්‍යාවේ 7 දැක්වෙන ඉලක්කමේ ස්ථානීය අගය කීය ද?

..................................................

(16) නිවැරදි පිළිතුර ලැබෙන සේ හිස් කොටු පුරවන්න.

(i)

```
  7657
+1□□□
  8802
```

(ii)

```
 □□□□
-3625
 4818
```

(17) (i) ලණුවක දිග සෙන්ටිමීටර 1135කි. එහි දිග මීටර හා සෙන්ටිමීටරවලින් කොපමණ ද?

.................. m ................. cm

(ii) එයින් 1m 25cm ක් කපා ඉවත් කළ විට ඉතිරි වන කැබැල්ලේ දිග කොපමණ ද?

.................. m ................. cm

(18) වෙළෙන්දෙක් අඹ ගෙඩි 784ක් මිල දී ගෙන ඉන් ගෙඩි 519ක් විකිණූ පසු ඉතිරි ගෙඩි උර 5කට සමානව වෙන් කරන ලදී. එක් ගෝනියක ඇති ගෙඩි ගණන කීය ද?

...........................................

(19) 20ට පෙර හා පසු සංඛ්‍යා රෝම සංඛ්‍යාවක් ලෙස ලියන්න.

........................................... ...........................................

(20) පහත වේලාවන් පැය 24 ඔරලෝසු වේලාවෙන් ලියන්න.

(i) ප.ව. 7.30 - ................................

(ii) පෙ.ව. 12.30 - ................................

(21) ක්‍රියාකාරකමක් සඳහා රවිඳු 10kg 35g ක වැලි මල්ලක් ද, නවිඳු 8kg 70g ක වැලි මල්ලක් ද ගෙ ආවෝ ය. දෙදෙනා ම ගෙන ආ වැලිවල මුළු බර කොපමණ ද?

.......... kg .......... g

(22) පහත දැක්වෙන්නේ නගරයක සිතියමකි.




(i) රෝහල උතුරු දිශාවෙන් ඇත්තේ මොනවා ද?

...........................................................

(ii) උසාවිය පිහිටා ඇත්තේ රෝහලට කුමන දිශාවෙන් ද?


...........................................................

(23) ජලය $3l$ 50m$l$ ඇති බඳුනකට තවත් ජලය $2l$ 75m$l$ ක් දැමූ විට බඳුනේ ඇති මුළු ජලය ප්‍රමාණය සොයන්න.

ලීටර ........................ මිලි ලීටර ..............................

(24) පන්තියක සිසුන් කැමති වර්ණ පිළිබඳ තොරතුරු පහත ප්‍රස්තාරයේ දැක්වේ.

ප්‍රස්තාරය ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(i) කහ පාටට කැමති සිසුන් ගණන කීය ද? .............................................................

(ii) පන්තියේ මුළු සිසුන් ගණන කීය ද? .............................................................

(iii) කොළ පාටට කැමති සිසුන් ගණන දම් පාටට කැමති සිසුන් ගණනින් ½ ක් නම් කොළ පාටට කැමති සිසුන් ගණන ප්‍රස්තාරයේ අඳුරු කර දක්වන්න.

(25) බීම බට 88කින් ½ ක් අයියාට ද, ඉතිරියෙන් ¼ ක් මල්ලීට ද, ඉතිරි ප්‍රමාණය නංගිට ද ලැබුණි. නංගිට ලැබුණ බීම බට ප්‍රමාණය කීය ද? ...................................

(26) සමාන හැඩැති පැති 6ක් ඇති ඝනවස්තුව නම් කරන්න.

..............................................

(27)  මෙම රූපය ඇසුරින් ඇඳිය හැකි සමමිතික අක්ෂ ගණන කීය ද?

.....................................

(28) රුපියල් 60 බැගින් එළවළු වර්ග 6ක් මිලට ගත් අම්මාට රුපියල් සියයේ නෝට්ටුවක් සහ තවත් නෝට්ටු 2ක් ඉතිරි මුදල් ලෙස ලැබුණි. අම්මා දුන් මුදල කීය ද?

රුපියල් ...................................

(29) පහත බිල්පත සම්පූර්ණ කරන්න.

| ද්‍රව්‍ය | ප්‍රමාණය | 1kg ක මිල | | වටිනාකම | |
|---|---|---|---|---|---|
| | | රුපියල් | සත | රුපියල් | සත |
| පරිප්පු | 1kg 500g | 300 | 00 | (i) .......... | ..... |
| තේ කුඩු | 250g | (ii) .......... | ..... | 200 | 00 |
| එකතුව | | | | (iii) .......... | ..... |

(iv) ඉහත බිල්පත ගෙවීමට රු. 1000.00ක් දුන් පසු ලැබෙන ඉතිරි මුදල කීය ද? ..........................

- **අංක 30 සිට 59 තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුර දී ඇති පිළිතුරු අතුරෙන් තෝරා යටින් ඉරක් අඳින්න.**

(30) එදිනෙදා තම වැඩ කටයුතු ක්‍රමානුකූල ව සාර්ථක කර ගැනීමට උපකාරී වන දෙයකි,

(i) දුරකතනය (ii) කාලසටහන (iii) නිල ඇඳුම

(31) උපදේශාත්මක කාව්‍ය ග්‍රන්ථයක් වන්නේ,

(i) සිදත් සඟරාව (ii) මහාවංශය (iii) සුභාෂිතය

(32) ජාතික කොඩිය පිළිබඳ නිවැරදි ප්‍රකාශයකි.

(i) වර්ණ පහකින් සමන්විත ය.
(ii) සුළු ජාතීන් නියෝජනය නොවේ.
(iii) දිග, පළල මෙන් දෙගුණයකි.

(33) විදේශිකයෙකු වුවද ලංකාවේ සම්මානනීය පුරවැසිබව ලබා ගත් ලොව ප්‍රසිද්ධ විද්‍යාඥයෙකි.

(i) හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා
(ii) ආතර් සී. ක්ලාක් මහතා
(iii) ඩන්කන් වයිට් මහතා

(34) වාහන ආදායම් බලපත්‍රයක් ලබා ගැනීමට ඔබ යා යුතු ස්ථානය,

(i) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
(ii) නගර සභාව
(iii) ග්‍රාම නිලධාරී කාර්යාලය

(35) බීජයක් පැළවීමට අත්‍යවශ්‍ය නොවන සාධකයකි.

(i) ජලය (ii) වාතය (iii) හිරු එළිය

(36) වන විනාශයේ අයහපත් බලපෑමක් වන්නේ,

(i) පස සෝදා යාම. (ii) ජල මූලාශ්‍ර ආරක්ෂා වීම. (iii) වාතය පිරිසිදු වීම.

(37) හූනා සතු ව ඇති සුවිශේෂ හැකියාවක් නොවේ,

(i) ඕනෑ ම මතුපිටක ඇවිදීමේ හැකියාව
(ii) පැටවු බිහි කිරීමේ හැකියාව
(iii) අනතුරක දී වලිගය කඩා දැමීමේ හැකියාව

(38) පාසල් සිසුවකු දිනකට පානය කළ යුතු අවම ජල ප්‍රමාණය

(i) ලීටර ½ - 1 (ii) ලීටර 1 ½ - 2 (iii) ලීටර 2 ½ - 3

(39) ලංකාවේ විදුලිය නිපදවීම සඳහා බහුල ව යොදා ගන්නා බල ශක්තියකි,

(i) සුළඟ (ii) හිරු එළිය (iii) ජලය

(40) වර්තමානයේ රසකාරක යොදන ලද ක්ෂණික ආහාර භාවිතය වැඩි වීම නිසා වැළඳිය හැකි රෝගයකි,

(i) චිකුන්ගුන්‍යා (ii) පිළිකා (iii) හෙපටයිටිස්


(41) ජාඩි දැමීම යනු,

(i) ධීවර කර්මාන්තයේ දී මසුන් ඇල්ලීම සඳහා භාවිත වන ක්‍රමයකි.
(ii) පලතුරු කල් තබා ගන්නා ක්‍රමයකි.
(iii) මාළු කල් තබා ගන්නා ක්‍රමයකි.

(42) දිවීමේ තරගයක යෙදී සිටින තරගකරුවකු තරගය අවසන් වූ විගස කළ යුතු දෙයකි,

(i) සරල ව්‍යායාමයක නිරත වීම
(ii) බිම හිඳ ගැනීම හෝ වැතිරීම
(iii) ජලය පානය කිරීම

(43)



ඉහත පරීක්ෂණය මගින් පැහැදිලි වන්නේ,

(i) බඳුනේ ඉහළ ජලයේ පීඩනය වැඩි බව ය.
(ii) බඳුනේ පහළට වන්නට ජලයේ පීඩනය වැඩි වන බව ය.
(iii) බඳුනේ පහළට වන්නට ජලයේ පීඩනය අඩු වන බව ය.

(44) ගොවීන් වැපිරීම සඳහා සුදුසු වී බීජ වඩා හොඳින් වෙන් කර ගැනීමට යොදා ගන්නා උපක්‍රමයකි,

(i) ලුණු මිශ්‍ර ජලයේ වී ගිල්වීම
(ii) කුල්ලෙන් පෙළීම
(iii) සුළං කිරීම


(45) පොදු ප්‍රවාහන සේවයේ දැකිය නොහැකි ලක්ෂණයකි,

(i) කාලසටහනකට අනුව ගමන් කිරීම

(ii) අවශ්‍ය ගමනාන්තයට එක ම රථයක ළඟා වීමට හැකි වීම

(iii) ටිකට් පතක් නිකුත් කිරීම

(46)




ඉහත පරීක්ෂණයේ ජලය මතට පොල්තෙල් තට්ටුවක් දමා ඇත්තේ,

(i) මුං බීජවල ආරක්ෂාව සඳහා ය.

(ii) මුං බීජ පැළවීමට පොල්තෙල් අවශ්‍ය නිසා ය.

(iii) ජලය තුළට වාතය ගමන් කිරීම වැළැක්වීම සඳහා ය.


(47) සුළං දිශා දර්ශකයේ ඊ හිස යොමු වන්නේ,

(i) සුළං හමා යන දිශාවට ය. (ii) සුළං හමා එන දිශාවට ය. (iii) උතුරු දිශාවට ය.

(48) ලෝක උරුමයක් ලෙස නම් කළ සීගිරියේ දක්නට නොලැබෙන දෙයකි,

(i) බුද්ධ ප්‍රතිමා (ii) බිතු සිතුවම් (iii) කැටපත් පවුර

(49) විදුලි බල්බ දෙක නොදැල්වෙන අවස්ථාව



(i) (ii) (iii)

(50) කාබෝහයිඩ්‍රේට්, කැල්සියම්, ප්‍රෝටීන්, අයඩීන් යන පෝෂ්‍ය පදාර්ථ නොලැබීමෙන් ශරීරයට ඇති විය හැකි ඌණතා පිළිවෙළින්,

(i) වර්ධනය බාල වීම, ශක්තිය අඩු වීම, අස්ථි රෝග, ගලගණ්ඩය

(ii) ශක්තිය අඩු වීම, අස්ථි රෝග, වර්ධනය බාල වීම, ගලගණ්ඩය

(iii) ශක්තිය අඩු වීම, ගලගණ්ඩය, වර්ධනය බාල වීම, අස්ථි රෝග

(51) අනාරක්ෂිත අවස්ථාවක් වන්නේ,

(i) නාය යන ස්ථානයක් (ii) සර්පයින් සිටින තුඹස (iii) දුම්රිය මාර්ගයේ ඇවිද යාම

(52) සතුන්ට හිතකර මිනිස් ක්‍රියාකාරකමක් නොවේ,

(i) වැලි ගොඩ දැමීම (ii) කාබනික පොහොර භාවිතය (iii) රුක් රෝපණය

(53) විද්‍යුත් චුම්බකයක් සෑදීමට යොදා නොගනී,

(i) වියළි කෝෂය (ii) කොයිල් කම්බි (iii) කාන්දම් කැබැල්ලක්

(54) ජලය හා බැඳි ආගමික චාරිත්‍රයකි,

(i) අවුරුදු චාරිත්‍රයක් ලෙස ළිඳ සමග ගනුදෙනු කිරීම.

(ii) සුබ කටයුත්තක දී ජලය පිරි බඳුනක් රැගෙන ඒම.

(iii) කුම්භාභිශේකම් චාරිත්‍රය.

(55) මෙම රූපික ප්‍රකාශනයෙන් අදහස් වන්නේ,

(i) වට රවුම ඉදිරියෙනි.

(ii) ප්‍රතිචක්‍රීකරණය කළ හැක.

(iii) දකුණට හැරී ගමන් කරන්න.



(56) ලංකාවේ පැවති සමාජ, ආර්ථික, දේශපාලන රටාව මුළුමනින් ම වෙනස් කිරීමට පුරෝගාමී වූයේ,

(i) ලන්දේසීන් ය (ii) ඉංග්‍රීසීන් ය (iii) පෘතුගීසීන් ය

(57) ප්‍රදේශයේ පැතිර යන බෝවන රෝගයක් පිළිබඳ ව දැක්විය යුත්තේ,

(i) සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීතුමාට

(ii) මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමාට

(iii) ග්‍රාම නිලධාරීතුමාට

(58) වාහනවල සවිකර ඇති අංක තහඩුවේ ඉහළ ඇති ඉංග්‍රීසි අකුරු දෙකෙන් කියවෙන්නේ,

(i) දිස්ත්‍රික්කය

(ii) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

(iii) පළාත

(59) වර්තමානයේ වෙනත් රටක වෙසෙන අයෙකුට පණිවිඩයක් යැවිය හැකි විශ්වාසදායී හා ඉක්මන් ක්‍රමය

(i) ගුවන් තැපැල් ක්‍රමය (ii) විද්‍යුත් තැපෑල (iii) මුහුදු තැපෑල

(60) සෑම සති අන්තයක ම සුනිමල් අම්මා සමග ගමේ අත්තම්මා බැලීම සඳහා යාමට පුරුදු ව සිටියි. අත්තම්මා ද තමන් එනතුරු මග බලා සිටින බව සුනිමල් හොඳින් දනියි. මෙවර ද සුනිමල් ගමේ මායට ආශාවෙන් සිටිය ද සති අන්තයේ දී පැවැත්වෙන පාසලේ ක්‍රීඩා පුහුණු කටයුතු සඳහා දරුවන් සියලු දෙනා සහභාගී විය යුතු බව ගුරුතුමිය දන්වා සිටියි.

මෙම අවස්ථාවේ දී සුනිමල් ට සිතෙන දේ පිළිබඳව වැකි 3ක් නිර්මාණය කරන්න.

සෑම වාක්‍යයක් ම වචන 5 කට නොඅඩු විය යුතුයි. උක්ත ආඛ්‍යාත හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතුයි.

(ලකුණු 6)

1. ..............................................................................................................

..............................................................................................................

2. ..............................................................................................................

..............................................................................................................

3. ..............................................................................................................

..............................................................................................................

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අංශයේ ප්‍රකාශනයකි.**

**5 වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව පෙරහුරු පරීක්ෂණය 2024**

**පිළිතුරු**

## ප්‍රශ්න පත්‍ර අංක 02 - I පත්‍රය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| (01) (iii) | (02) (ii) | (03) (iii) | (04) (ii) | (05) (i) | (06) (i) | (07) (iii) | (08) (ii) | (09) (iii) | (10) (ii) |
| (11) (iii) | (12) (ii) | (13) (ii) | (14) (iii) | (15) (iii) | (16) (i) | (17) (iii) | (18) (ii) | (19) (iii) | (20) (iii) |
| (21) (iii) | (22) (ii) | (23) (ii) | (24) (ii) | (25) (ii) | (26) (iii) | (27) (i) | (28) (ii) | (29) (iii) | (30) (i) |
| (31) (i) | (32) (iii) | (33) (i) | (34) (iii) | (35) (ii) | (36) (iii) | (37) (ii) | (38) (i) | (39) (iii) | (40) (i) |

## ප්‍රශ්න පත්‍ර අංක 02 - II පත්‍රය

(01) (i) දියමංකඩ (ii) සැනසිල්ලේ ගිමන් හරින්නවුන් පරිද්දෙන් (iii) මුවෝ (iv) දිය බීමට මුවා පැමිණියේ ය. (v) රංචුවක් (vi) පාසල් වත්ත අසලින්/අද්දරින් (ලකුණු 06) (02) (i) ත (ii) ණැ (ලකුණු 02) (03) ග්‍රන්ථ/කෘති/පුස්තක අපේ නෙත් වැනි ය. (ලකුණු 01) (04) උගත මනා ශිල්පය ම යි මතු රැකෙනා (ලකුණු 01) (05) ඇස්. මහින්ද හිමි ''නිදහසේ මන්ත්‍රය'' රචනා කළේ ය. (ලකුණු 02) (06) ගෙදර ගොස් තාත්තා පත්තරය බැලුවේ ය. (ලකුණු 01) (07) කිසිවක් අත නොහැර කියවීම සහ කතා කිරීම. (ලකුණු 01) (08) මහදැනමුත්තාගේ නුවණ වගේ (ලකුණු 01) (09) (i) සැදුවා ය. (ii) බසියි. (iii) මම (iv) වැටුණේ ය. (ලකුණු 04) (10) (i) කුස්සිය / මුළුතැන්ගෙය (ii) මදුරුවා (ලකුණු 02) (11) It is on the table (ලකුණු 01) (12) frock (ලකුණු 01) (13) මට ආප්ප ඕනෑ (ලකුණු 01) (14) ඔරු මණි (ලකුණු 01) (15) (i) දහ නවදහස් පහ (ii) 1000 (ලකුණු 02) (16) (i) 145 (ii) 8443 (ලකුණු 02) (17) (i) 11m 35cm (ii) 10m 10cm (ලකුණු 02) (18) 53 (ලකුණු 02) (19) XIX, XXI (20) (i) 19:30 (ii) 00:30 (21) 18kg 105g (22) (i) පල්ලිය හා පොලීසිය (ii) බටහිර / බස්නාහිර දිශාවෙන් (23) 5*l* 125m*l* (24) (i) 5 (ii) 26 (iii) 2 (ප්‍රස්තාරය පාට කර තිබිය යුතුයි.) (25) 33 (26) ඝනකය (27) 4 (28) රු. 500.00 (29) (i) රු. 450.00 (ii) රු. 800.00 (iii) රු. 650.00 (iv) රු. 350.00 (30) (ii) (31) (iii) (32) (iii) (33) (ii) (34) (i) (35) (iii) (36) (i) (37) (ii) (38) (ii) (39) (iii) (40) (ii) (41) (iii) (42) (i) (43) (ii) (44) (i) (45) (ii) (46) (iii) (47) (ii) (48) (i) (49) (ii) (50) (ii) (51) (iii) (52) (i) (53) (iii) (54) (iii) (55) (ii) (56) (ii) (57) (ii) (58) (iii) (59) (ii) (60) වැකි නිවැරදිව ලියා තිබිය යුතුයි. අක්ෂර වින්‍යාසය හා පැහැදිලි බව සඳහා ලකුණු 02

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අංශයේ ප්‍රකාශනයකි.


**5 වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව පෙරහුරු පරීක්ෂණය 2024**

**ප්‍රශ්න පත්‍ර අංක 03 - I පත්‍රය**

**විභාග අංකය : ......................................... කාලය පැය :- 1යි.**


- හිස්තැනට ගැළපෙන කොටස තෝරන්න.

(01)



(i) (ii) (iii)

(02)



(i) (ii) (iii)


(03) මෙම රූප තුනට ම අදාළ ප්‍රකාශය තෝරන්න.



(i) ශ්‍රව්‍ය (ii) දෘශ්‍ය (iii) ශ්‍රව්‍ය / දෘශ්‍ය


- රටා අනුව හිස්තැනට ගැළපෙන පිළිතුර තෝරන්න.

(04)




(i) 64 (ii) 100 (iii) 121

(05)





(i) 12 (ii) 10 (iii) 15

(06) මහරගම යන වචනය සංකේත ඇසුරින් දක්වා ඇත්තේ △□○✳△ ආකාරයට ය. ඒ අනුව "මනහර" යන වචනයේ සංකේත යෙදී ඇති පිළිතුර තෝරන්න.

(i) △□□○ (ii) △○□✳ (iii) △○✳□

(07) පහත රූපසටහන පිළිබඳ නොගැළපෙන ප්‍රකාශය වන්නේ,




(i) කූඩුව තුළ සිටින සතුන් ගණන දෙකකි.

(ii) මෙහි සිටින සතුන් ගණන හයකට වඩා වැඩි ය.


(iii) මෙහි සිටින සීබ්‍රාවුන් ගණන දෙකකි.

(08) පහත රූපයට අනුව කොමඩු ගෙඩිවල බර වන්නේ,




(i) 3kg (ii) 2kg 700g (iii) 3kg 300g


(09)



මෙම රූපයේ ඇති ත්‍රිකෝණ ගණන වන්නේ,

(i) 5 (ii) 6 (iii) 8

(10) මෙම සටහන අනුව A ස්ථානයට යෙදිය හැකි සංඛ්‍යාව වන්නේ,





(i) 9, 18

(ii) 12, 24

(iii) 8,16

- **පහත දැක්වෙන ඝනකාකාර ලී කුට්ටිය වටේ තීන්ත ආලේප කර කුඩා ඝනකවලට වෙන්කර ගනී.**




(11) පැති දෙකක පමණක් තීන්ත ආලේප වී ඇති ඝනක ගණන වන්නේ,

(i) 24 (ii) 16 (iii) 20

(12) එක් පැත්තකවත් තීන්ත ආලේප වී නොමැති ඝණක ගණන වන්නේ,

(i) 16 (ii) 12 (iii) 8

(13) පහත සංඛ්‍යා පුවරු ආරෝහණ ක්‍රමයට සකස් කිරීමේ දී ස්ථානය වෙනස් වන පුවරු ගණන කීය ද?





(i) හතරයි (ii) තුනයි (iii) දෙකයි

(14) පබළු වැලක පබළු අමුණා ඇත්තේ රතු පබළු දෙකකට පසුව නිල් පබළු දෙකක් එන ලෙසිනි. ආරම්භයේ සහ අවසානයේ රතු පබළු අමුණා ඇත. එහි නිල් පබළු 15ක් අමුණා ඇත්නම් පබළු වැලේ ඇති පබළු ගණන කීය ද?

(i) 12 (ii) 27 (iii) 15

(15) පහත සැමන් ටින් එකෙහි පිටින් අලවා ඇති දවටනය තිත් ඉර දිගේ සරල රේඛීයව කපා දිග හැරිය විට සැදෙන හැඩතලය වන්නේ,



(i) ඍජුකෝණාස්‍රයකි.

(ii) වෘත්තයකි.

(iii) සමචතුරස්‍රයකි.

(16) මාලා පෙරවරු 7.00 සිට පස්වරු 2.00 දක්වා ද තමරා පෙරවරු 10.00 සිට පස්වරු 4.00 දක්වා ද විහාරා පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා ද මහජන පුස්තකාලයේ රැඳී සිටියේ නම් තිදෙනා ම එක විට පුස්තකාලයේ රැඳී සිටි කාලය කොපමණ ද?

(i) පැය 05 (ii) පැය 04 (iii) පැය 02

(17) තොරණක රතු බල්බ මිනිත්තු හතරකට වරක් දැල්වේ. නිල් බල්බ මිනිත්තු 10කට වරක් ද, කහ බල්බ මිනිත්තු 12කට වරක් ද දැල්වෙන අතර තොරණ ආරම්භයේ දී සියලු බල්බ දැල්වේ. තොරණේ ආරම්භය පස්වරු 6.30 ට නම් නැවත සියලු බල්බ එකවර දැල්වෙන්නේ කුමන වේලාවට ද?

(i) පස්වරු 7.30 (ii) පස්වරු 6.45 (iii) පස්වරු 7.00

(18) පියුමි තම යෙහෙළියන්ට ඡායාරූපයක් පෙන්වමින් මෙහි සිටින්නේ මාගේ අත්තම්මාගේ දියණියගේ එක ම දියණිය යැයි ප්‍රකාශ කළා ය. එම ඡායාරූපයේ සිටින්නේ,

(i) පියුමිගේ මව (ii) පියුමිගේ දුව (iii) පියුමි

(19) වෙළඳසැලක සබන් කැට අසුරා ඇත්තේ උඩ ම පේළියේ සිට පහළ පේළිය දක්වා එක බැගින් වැඩිවන ආකාරයට ය. උඩ ම පේළියේ සබන් කැට එකකි. සබන් කැට අසුරා ඇති පේළි ගණන 8 ක් නම් මුළු සබන් කැට ගණන කීය ද?

(i) 36 කි. (ii) 30 කි. (iii) 18 කි.

(20) පොකුණක පාසි වැවෙන්නේ පළමු දින මෙන් දෙගුණයක් දෙවන දිනයේ ද දෙවන දිනයේ මෙන් දෙගුණයක් තෙවන දිනයේ ද වන ආකාරයට ය. පොකුණේ හරි අඩක් පාසි වැවීමට දින 8ක් ගත වේ නම් සම්පූර්ණ පොකුණ පාසිවලින් වැසීමට යන දින ගණන වන්නේ,

(i) දින 16 යි. (ii) දින 9 යි. (iii) දින 10 යි.

(21) මිතුරන් පස්දෙනෙකු එකිනෙකාට අතට අත දෙනු ලැබේ. ඒ අනුව සියලු දෙනා ම අතට අත දෙන මුළු වාර ගණන කීය ද?

(i) 10 (ii) 8 (iii) 12

(22) පාදයක් 9cm වන සමචතුරස්‍රාකාර හැඩයක් ඇති කම්බියක් දිග හැර සමපාද ත්‍රිකෝණයක් සෑදුවහොත් පාදයක දිග වන්නේ,

(i) 36 cm (ii) 12 cm (iii) 9 cm

(23) විභාග ප්‍රශ්න පත්‍රයකට ප්‍රශ්න 40 කි. නිවැරදි පිළිතුරක් සඳහා ලකුණු දෙකක් ලැබෙන අතර වැරදි පිළිතුරකට ලබාගත් ලකුණුවලින් ලකුණු 1 බැගින් අඩු වේ. සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු ලියා ප්‍රශ්න 33ක් නිවැරදි නම් ලැබිය යුතු ලකුණු ගණන වන්නේ,

(i) 66 (ii) 73 (3) 59

(24) අජිත් සහ කමල්ගේ බරෙහි එකතුව 65 kg වේ. අජිත් සහ සමිත්ගේ බරෙහි එකතුව 75 kg වේ. මෙම තිදෙනාගේ ම බරෙහි එකතුව 105 kg ක් වේ නම් කමල්ගේ බර කොපමණ ද?

(i) 30 kg (ii) 35 kg (iii) 40 kg


(25) මම සංඛ්‍යාවක් සිතුවෙමි. එයට පහක් එකතු කර ලැබෙන පිළිතුරෙහි දෙගුණයෙන් එකක් අඩු කළ විට පිළිතුර 33 වේ. මා සිතූ සංඛ්‍යාව කුමක් ද?

(i) 34 (ii) 17 (iii) 12

(26) එකේ සිට අසූ අට (88) තෙක් සංඛ්‍යා ලිවීමේ දී අටේ ඉලක්කම යෙදෙන වාර ගණන වන්නේ,

(i) 16 (ii) 17 (iii) 18

•





(27) ඉහත රූපයට අනුව "◯" හි අගය වන්නේ,

(i) 15 (ii) 7 (iii) 6

(28) මෙහි "?" ලකුණ යෙදෙන ස්ථානයට ලැබෙන අගය වන්නේ,

(i) 17 (ii) 18 (iii) 15

• **පහත ඝනක ඇසුරින් පිළිතුරු සපයන්න.**





(29) E ට විරුද්ධ පැත්තේ ඇති ඉංග්‍රීසි අක්ෂරය වන්නේ,

(i) F (ii) A (iii) B

(30) D අකුරට විරුද්ධ පැත්තේ F අක්ෂරය නම් C අකුරට විරුද්ධ පැත්තේ ඇති ඉංග්‍රීසි අක්ෂරය වන්නේ,

(i) A (ii) F (iii) B

(31)



කුඩා දරුවෙක් කුඩා ඝනක යොදාගෙන කළ නිර්මාණයක් ඉහත දැක්වේ. එය ඝනකයක් බවට පත්කිරීමට තව කුඩා ඝනක කොපමණ අවශ්‍ය ද?

(i) 27 (ii) 18 (iii) 9


(32) සුපුන් උතුරු දිශාවට මීටර 10ක් ගමන් කර නැගෙනහිර දිශාවට හැරී මීටර 15ක් ඉදිරියට ගමන් කර නැවත දකුණු දිශාවට හැරී මීටර 20ක් ගමන් කර නවතී. දැන් සුපුන් සිටින්නේ ආරම්භක ස්ථානයට කුමන දිශාවෙන් ද?

(i) නැගෙනහිර (ii) දකුණ (iii) ගිනිකොණ

(33) සමචතුරස්‍රාකාර කඩදාසියක් ගෙන එය හතර වාරයක් එක මත එක නැමුවහොත් කුඩා සමචතුරස්‍ර කීයක් ලැබෙයි ද?

(i) 4 (ii) 16 (iii) 8

(34)





මෝටර් රථය A සිට පැයට 50km වේගයෙන් ද ජීප් රථය B සිට පැයට 40 km වේගයෙන් ද එකවර ගමන් අරඹති. වාහන දෙක මුණ ගැසෙන්නේ ගමන් අරඹා කුමන වේලාවකට පසුව ද?

(i) පැය 1.20 (ii) පැය 2 (iii) පැය බාගයක්


(35) මීටර 100 ක් දිග තාප්පයක මීටර හතරෙන් හතර බල්බ සවිකර ඇත. සවිකර ඇති බල්බ ගණන කීය ද?

(i) 25 (ii) 26 (iii) 27


(36) 12.30ට පැය දෙකකට පෙර වේලාව සඳහන් වන ඔරලෝසුවක් කැඩපතකින් බැලූ විට පෙනෙන ආකාරය වන්නේ,




(i)




(ii)




(iii)

(37) දුම්රියක නිදන මැදිරිය පිහිටා ඇත්තේ පළමු මැදිරියේ සිට 15වන මැදිරිය වන අතර අවසාන මැදිරියේ සිට 6 වන මැදිරියයි. දුම්රියේ ඇති මැදිරි සංඛ්‍යාව කීය ද?

(i) 20 (ii) 21 (iii) 19


(38) පෙරේදාට පෙර දවස සඳුදා නම් අනිද්දාට පසු දවස වන්නේ,

(i) අඟහරුවාදා (ii) සෙනසුරාදා (iii) ඉරිදා

(39) වෙළෙන්දෙක් දිවුල් ගෙඩි 100 ක් රු.2000.00 ක් දී මිල දී ගත්තේ ය. ඔහු ඒ ගෙඩි සියල්ල විකුණා අවසන් වූ විට රුපියල් 1000.00 ක ලාභයක් ලබා තිබුණි. දිවුල් ගෙඩියක් විකුණූ මිල කීය ද?

(i) රුපියල් 20.00 (ii) රුපියල් 30.00 (iii) රුපියල් 10.00

(40)



මෙහි අඳුරු නොකළ කොටස සම්පූර්ණ රූපයෙන් කොපමණ ප්‍රමාණයක් ද?

(i) $\frac{2}{9}$ (ii) $\frac{7}{9}$ (iii) $\frac{2}{3}$

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අංශයේ ප්‍රකාශනයකි.**

**5 වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව පෙරහුරු පරීක්ෂණය 2024**

**ප්‍රශ්න පත්‍ර අංක 03 - II පත්‍රය**

**විභාග අංකය : ................................. කාලය : පැය1යි මිනිත්තු 15 යි.**

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(01) පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට ඡේදය ඇසුරෙන් ම පිළිතුරු සපයන්න.

සිසිර ඉසුඹුවට පසු සිසුහු පාසල වෙත පැමිණිය හ. විස්මිත දෙයක් දක්නට ලැබී ඔවුහු සතුටෙන් කෑ ගසන්නට වූහ. පන්ති කාමර මැදිරි පෙළට විරුද්ධ පැත්තෙන් රූස්වීම් හල අසල මල් පාත්ති පසුපස, නව මැදිරිය නැගී සිටියේ ය. ඔවුන් නොසිටි දිනවල එය පොත්ගුලක් බවට පෙරළී තිබිණ. සියලු ම දෙනා ගරු කළ, හැම වැඩක් ම කිරීමට සමත් මුරකරු වූ රියෝ චං බොහෝ වෙහෙස මහන්සි වී වැඩ කර තිබිණි. පොත් රාක්ක විශාල ගණනක් සවි කොට, සියලු ම වර්ගවල වර්ණවත් පොත් පේළිවලින් ඒවා පුරවා තිබිණ. හිඳගෙන කියවීම සඳහා පුටු සහ මේස තබා තිබිණි.

- ඡේදය ඇසුරෙන් පිළිතුරු සපයන්න.

(I) හැම වැඩක් ම කිරීමට සමත් වූ මෙහි සඳහන් පුද්ගලයාගේ නම කුමක් ද? ...................................

(II) `පන්ති කාමර මැදිරි පෙළට විරුද්ධ පැත්තෙන් නැගී තිබුණේ කුමක් ද? ...................................

(III) ඡේදයේ සඳහන් ප්‍රථම පුරුෂ, බහුවචන, අනුක්ත නාමපදය කුමක් ද? ...................................

(IV) පෙරළී යන වචනයේ ඉරි ඇඳි අකුරෙහි යෙදී ඇති පිල්ලම නම් කරන්න. ...................................

(V) සඤ්ඤක අකුරක් සහිත වචනයක් ඡේදයෙන් තෝරා ලියන්න. ...................................

(VI) පුස්තකාලය යන අදහස සහිත ඡේදයේ යෙදී ඇති වචනය කුමක් ද? ...................................

(02) පහත සඳහන් වගන්තිවල උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් ( × ) ලකුණ ද වරහන තුළ යොදන්න.

(I) ගැල් කණ්ඩායම දැකුම්කලු විශාල වෘක්ෂයක් දුටුවේ ය. (    )

(II) ඔවුන් උදෑසනින් ම කුඹුරට ගිය හ. (    )

(III) ගංගාවෝ අපගේ සොහොයුරෝ වෙති. (    )

(03) අතීත කාල බහුවචන ක්‍රියාපදය තෝරා යටින් ඉරක් අඳින්න.

(I) (i) නටති (ii) විසුවේ ය (iii) කළ හ.

(II) (i) වූහ (ii) කරහි (iii) බලන්නෙහු

(04) දී ඇති වචන ගළපා අර්ථවත් වැකියක් තනන්න.

සංවේදීතාව / ඉවහල් / සාර්ථකත්වය / පරිසරය / කෙරෙහි / නිර්මාණකරණයේ / වික්‍රමසිංහ / සඳහා / විය / දැක්වූ / මහතාගේ

...................................................................................................................................................

...................................................................................................................................................

...................................................................................................................................................

(05) පහත වචනවල හිස්තැනට සුදුසු නිවැරදි අක්ෂරය තෝරා හිස්තැනෙහි ලියන්න.

(I) විශේ.......ණ (ෂ/ශ)

(II) සංරක්ෂ....... (න/ණ)

(III) .......යකරු (ණ/න)

(IV) වාර්....... (තා/ථා)

(V) සාකච්.......ව (චා/ඡා)

(VI) ආරූ....... (ඪ/ඩ)

(06) පහත සඳහන් වාක්‍යය ලිඛිත බසට හරවා ලියන්න.

අපි මල් කඩා මාල හැදුවා.

..........................................................................................................

(07) ගැළපෙන වචනය තෝරා හිස්තැනෙහි ලියන්න.

| නළ , නල , වණය , වනය |
|---|

(I) තුවාලය යන අර්ථය දෙන පදය ..........................................

(II) කැලය යන අර්ථය දෙන පදය ..........................................

(III) බටය යන අදහස දෙන පදය ..........................................

(IV) සුළඟ යන අදහස දෙන වචනය ..........................................

(08) පහත අදහස දෙන ප්‍රස්ථාව පිරුළ ලියන්න.

(I) දැනටමත් උග්‍ර වී ඇති ප්‍රශ්නයක් තවදුරටත් උග්‍ර කිරීම.

...................................................................................................................................................

(II) ගැළපෙන අදහස් හා ගතිගුණ ඇති දෙදෙනෙකු සඳහා යෙදේ.


...................................................................................................................................................

(09) සුදුසු විරාම ලකුණු යොදන්න.

(I) සිබිල් නැන්දා හෙවත් සිබිල් වෙත්තසිංහ මැතිණිය එදා ඒ සිහින දුටු කුඩා දැරියයි.

(10) එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය තිත් ඉර මත ඉංග්‍රීසි අකුරෙන් ලියන්න.

(I) 

(II) 

.................................... ....................................

(11) පහත දී ඇති වචන නිවැරදිව ගළපා අර්ථවත් වැකියක් බැගින් ලියන්න.

I have / Do / pencil / you / a ?

..........................................................................................................

(12) ඉංග්‍රීසි වචනයෙහි අර්ථය සිංහලෙන් ලියන්න.

(I) National Dress - ..............................................................

(13) 'පාට්ටි මාර්' යන දෙමළ වචනය සඳහා යෙදෙන සිංහල වචනය ලියන්න.

....................................................................................

(14) පහත සඳහන් වාක්‍යය දෙමළෙන් කියන ආකාරය සිංහලෙන් ලියන්න.

(I) මට බඩගිනියි - ...............................................................

- **තිත් ඉර මත පිළිතුර ලියන්න.**

(15) ''දහහත් දහස් දහ නවය'' මෙම සංඛ්‍යාව ඉලක්කමෙන් ලියන්න.

.......................................................................................................... (ලකුණු 01)

(16) පහත සංඛ්‍යා ආරෝහණ පටිපාටියට ලියා දක්වන්න.

3026 , 30106 , 3100

.......................................................................................................... (ලකුණු 02)

(17) පහත දී ඇති සංඛ්‍යා අතරින් සංඛ්‍යා දෙකක් අතර පොදු අන්තරය 4ක් වන සංඛ්‍යා පමණක් තෝරා රටාවක් ගොඩනගන්න.

| | | |
|---|---|---|
| 57 | 40 | 43 |
| 45 | 52 | 49 |
| 41 | 53 | 37 |

.................................................................................... (ලකුණු 02)

(18) දී ඇත්තේ ඩොමිනෝ පත් කට්ටලයකි. එහි හිස්තැන්වලට ගැළපෙන සංඛ්‍යා යොදන්න. (ලකුණු 02)

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 27 | 30 × 6 | 180 | 21 × 7 | 147 | 12 × ....... | 96 | 3 × 9 |


(19) ත්‍රී වීලර් 250 ක හා වීල්බැරෝ 250 ක ඇති මුළු රෝද ගණන කොපමණ ද? ....................................................

(ලකුණු 02)

(20) විනෝද චාරිකාවක් යාම සඳහා සිසුන් 232ක් පැමිණ සිටි අතර බස්රථ 4 කට සමාන ලෙස නංවනු ලැබී ය. එක් බස් රථයකට නැගි සිසුන් සංඛ්‍යාව කොපමණ ද? ..................................................................

(ලකුණු 02)

(21) මෙම රූපය තිරස් ලෙස සමමිතික රේඛාවකින් වෙන්කළ විට සෑදෙන සමචතුරස්‍ර ගණන කීය ද? .....................




(ලකුණු 02)

(22) ට්‍රැක්ටරයක පටවාගෙන ආ උළු කැට ගොඩකින් ¼ ක් බිඳී තිබුණි. එම ප්‍රමාණය 129කි. බිඳී නොතිබූ උළු කැට ප්‍රමාණය කොපමණ ද?

(ලකුණු 02)

(23) රූපසටහන ඇසුරින් පිළිතුරු සපයන්න.




(ලකුණු 02)

A ස්ථානයේ සිට D ස්ථානය දක්වා ඇති දුර කොපමණ ද?

(24) xx - ix = ................... මෙහි පිළිතුර රෝම ඉලක්කමෙන් හිස්තැනෙහි ලියන්න. (ලකුණු 02)

(25) දෙහි 1kg කින් ලබාගත් යුෂ මිශ්‍ර කර දෙහි බීම 2$l$ සෑදිය හැකි ය. දෙහි 500g කින් ගත් යුෂ මිශ්‍ර කර සෑදිය හැකි දෙහි බීම ප්‍රමාණය කොපමණ ද?


.....................................................................................

(ලකුණු 02)

(26) චීත්ත රෙදි මීටරයක මිල රු.75.00 කි. සෙරෙප්පු කුට්ටමක මිල රු.450.00 කි. රෙදි මීටර 2ක් හා සෙරෙප්පු කුට්ටමක් මිල දී ගැනීමට කොපමණ මුදලක් අවශ්‍ය වන්නේ ද? ..................................................

(ලකුණු 02)

(27)



(I) සම්පූර්ණ රූපයෙන් ¾ ක් පාට කළ යුතු නම් ඒ සඳහා තව කොටස් කීයක් පාට කළ යුතු ද? ...........................................................................

(II) පාට කර දක්වන්න.


(ලකුණු 02)

(28) මිනිත්තු කටුව 12 සිට 4 ඉලක්කම දක්වා ගමන් කර ඇති විට ගත වූ කාලය විනාඩි කීය ද?

.....................................................................

(ලකුණු 01)

(29) පහත දැක්වෙන්නේ සිසුන් කණ්ඩායමකගේ විනෝදාංශ පිළිබඳ තොරතුරු ප්‍රස්තාරයකි.




(ලකුණු 02))

(I) චිත්‍ර ඇඳීම විනෝදාංශ කොටගත් ළමුන් ගණන 06 කි. එම ප්‍රමාණය ප්‍රස්තාරයේ දක්වන්න.

(II) වැඩි ම සිසුන් පිරිසක් කැමති විනෝදාංශය කුමක් ද? ............................................

- **අංක 30 සිට 59 දක්වා එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුරු දී ඇති පිළිතුරු අතුරෙන් තෝරා යටින් ඉරක් අඳින්න.**

(30) ශ්‍රී ලාංකිකයන් ගේ ජන ක්‍රීඩාවක් නොවන්නේ,

(1) චක්ගුඩු පැනීම (2) එළුවන් කෑම (3) බනිස් කෑම

(31) අප රටට ආවේණික පාන වර්ග වේ.

(1) බෙලිමල්, වරාමල් (2) පෙනෙල, පොල්පලා (3) ඉරමුසු, රණවරා

(32) වෙස්මුහුණු සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ නගරයකි.

(1) බලංගොඩ (2) අම්බලන්ගොඩ (3) අම්බලන්තොට

(33) සැරසිලි නිර්මාණ කිරීම සඳහා යොදාගත හැකි පරිසර හිතකාමී ද්‍රව්‍ය වේ.

(1) පන් කොළ, ටොෆි කොළ (2) පොල් කොළ, ඉටි කොළ (3) ගොක් කොළ, තල් කොළ

(34) බීජ රාශියක් ඇති පළතුරක් නොවේ.

(1) දෙළුම් (2) රඹුටන් (3) දොඩම්

(35) කඩොලාන පරිසරයේ හැදෙන ශාක වර්ගයකි.

(1) පතොක් (2) කටුපිල (3) කිරල

(36) ශාක භක්ෂක සතුන් පමණක් අඩංගු පිළිතුර වන්නේ,

(1) හාවා, කුකුළා, කපුටා (2) එළුවා, හරකා, මුවා (3) ලේනා, නරියා, ගෙම්බා

(37) ශ්‍රී ලංකාවට ආවේණික මත්ස්‍ය විශේෂයකි.

(1) මෝරා (2) දැල්ලා (3) මල් පුළුට්ටා

(38) විටමින් D ඌණතාවය නිසා අපට ඇතිවන රෝගී තත්ත්වයකි.

(1) ඇස් පෙනීම දුර්වල වීම. (2) සම ඉරිතැලීම. (3) අස්ථි ආශ්‍රිත රෝග ඇති වීම.

(39) අපගේ ශරීරයට කැල්සියම් ලැබෙන ආහාරයකි.

(1) නෙළුම් අල (2) මුහුදු මාළු (3) සෝයා බෝංචි

(40) අතීතයේ දී තෙල් සිඳීමට භාවිත කළ උපකරණය වන්නේ,

(1) සකපෝරුව (2) සෙක්කුව (3) වරක්කලය

(41) ශක්තිය වැඩියෙන් ම වැයවන ක්‍රීඩාවක් වන්නේ,

(1) කඹ ඇදීම (2) චෙස් ඇදීම (3) බට්ටා පැනීම

(42) රට ඉඳි වැඩිපුර ම ආහාරයට ගන්නා ජන වර්ගයකි.

(1) ද්‍රවිඩ (2) මුස්ලිම් (3) සිංහල

(43) උතුරු පළාතට හා උතුරු මැද පළාතට අයත් දිස්ත්‍රික්ක අනුපිළිවෙළින් දක්වා ඇත්තේ,

(1) කෑගල්ල, මඩකලපුව (2) පොළොන්නරුව, යාපනය (3) කිලිනොච්චිය, අනුරාධපුරය

(44) ජලයට දැමූ විට වායු බුබුළු දැකිය හැකි ද්‍රව්‍යය කුමක් ද?

(1) වීදුරු කැබලි (2) ගඩොල් කැබලි (3) කළුගල් කැබලි

(45) දෝලාව භාවිත කර ඇත්තේ,

(1) කාලය මැනීමට (2) පණිවිඩ යැවීමට (3) ගමන් යාමට

(46) කොම්පෝස්ට් පොහොර සෑදීම සඳහා යොදාගන්නා ශාක පත්‍ර විශේෂයකි.

(1) දෙල් කොළ (2) ඇල්බීසියා කොළ (3) අක්කාපාන කොළ

(47) ආහාර කල්තබා ගැනීමේ දී ඇඹුල් තියල් කිරීම සඳහා ගන්නා මාංශ ජනක ආහාරයක් වන්නේ,

(1) සෝයා මීට් (2) පොළොස් (3) මාළු


(48) ගඩොල් කුඩු සහ දෙහි ඉස්ම යොදාගෙන ඔප මට්ටම් කළ හැකි භාණ්ඩයකි.

(1) දැව අල්මාරිය (2) පිත්තල හෙප්පුව (3) මැටි කළය

(49) බෝග වගාව කෘමීන්ගෙන් ආරක්ෂා කරගැනීම සඳහා ස්වාභාවිකව කෘමි නාශකයක් සාදා ගතහැකි බීජ වර්ගයකි.

(1) දොඹ ඇට (2) රබර් ඇට (3) කොහොඹ ඇට

(50) පහත බඳුන තුළ ඇති බීජවලට සිදුවිය හැක්කේ,




(1) ඉක්මණින් පැළවීම.

(2) ඉක්මණින් පැළ නොවීම.

(3) කිසිසේත් පැළ නොවීම.

(51) දණ්ඩ චුම්භක දෙකක සමාන ධ්‍රැව දෙක ළං කළ විට,

(1) ආකර්ෂණය වේ. (2) විකර්ෂණය වේ. (3) කිසිවක් සිදු නොවේ.

(52) විනිවිද පෙනෙන බෝතලයකට පස් ස්වල්පයක් දමා ජලය පුරවා බෝතලය වසා හොඳින් සොලවා තබන්න. ඉන්පසුව බැලූ විට පතුලේ තැන්පත් වී ඇත්තේ,

(1) වැලි (2) බොරළු (3) රොන් මඩ

(53) බසවක්කුලම වැව හා මින්නේරිය වැව සාදවන ලද රජවරු පිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ,

(1) දේවානම්පියතිස්ස රජතුමා, මහසෙන් රජතුමා

(2) පණ්ඩුකාභය රජතුමා, මහසෙන් රජතුමා

(3) මහසෙන් රජතුමා, අභය රජතුමා

(54) මළකඩ සහිත ඇණයක් පාදයේ ඇනුන විට පානය කිරීමට දෙන ඖෂධීය පානයකි.

(1) රණවරා (2) වෙනිවැල්ගැට (3) කොත්තමල්ලි

(55) ක්ෂීරපායී සතෙකු වන්නේ,

(1) කබරගොයා (2) මුගටියා (3) කටුස්සා

(56) යකඩ බහුල ආහාර කාණ්ඩයට අයත් වන්නේ,

(1) මුරුංගා කොළ, නිවිති

(2) රටකජු, මස්

(3) කජු පුහුලන්, රටකජු

(57) සිදුරු කැමරාවකින් ගසක් දෙස බැලූ විට දැකිය හැකි ආකාරය වන්නේ,

(1) උඩුකුරුව ය. (2) යටිකුරුව ය. (3) සමාන්තරව ය.

(58) ශ්‍රී ලංකාවට බටහිරින් පිහිටා ඇත්තේ,

(1) ඉන්දියාව (2) මැලේසියාව (3) අප්‍රිකානු රටවල්

(59) විද්‍යුත් මාධ්‍ය භාවිතයෙන් පමණක් පණිවුඩ හුවමාරු කරගන්නා මාධ්‍ය ඇතුළත් පිළිතුර වන්නේ,

(1) ටෙලිමේල් , පෝස්ටර් , දුරකථන

(2) ටෙලිමේල් , රූපවාහිනිය , ගුවන් විදුලිය

(3) රූපවාහිනිය , සඟරා , විද්‍යුත් තැපැල

(60) ගෙවතු වගාව මගින් අපට ආහාර සඳහා අවශ්‍ය බොහෝ දේ ලබාගත හැකි ය. කුඩා ගෙවත්තක වුවත් ඉඩකඩ ඇති පරිදි වගා කටයුතු කිරීමට අපට හැකි වේ.

'' ගෙවතු වගාවෙන් අපට ලැබෙන ප්‍රයෝජන'' යන මාතෘකාව යටතේ වැකි 3 ක් නිර්මාණය කර ලියන්න.

(සෑම වාක්‍යයක් ම වචන පහකට නො අඩු විය යුතු ය. උක්ත ආඛ්‍යාත සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතු ය.)

(1) ..........................................................................................................................................

..........................................................................................................................................

(2) ..........................................................................................................................................

..........................................................................................................................................

(3) ..........................................................................................................................................

..........................................................................................................................................

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අංශයේ ප්‍රකාශනයකි.**
**5 වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව පෙරහුරු පරීක්ෂණය 2024**
**පිළිතුරු**

## ප්‍රශ්න පත්‍ර අංක 03 - I පත්‍රය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| (01) (i) | (02) (iii) | (03) (i) | (04) (iii) | (05) (ii) | (06) (i) | (07) (ii) | (08) (ii) | (09) (iii) | (10) (ii) |
| (11) (i) | (12) (iii) | (13) (iii) | (14) (ii) | (15) (i) | (16) (ii) | (17) (i) | (18) (iii) | (19) (i) | (20) (ii) |
| (21) (i) | (22) (ii) | (23) (iii) | (24) (i) | (25) (iii) | (26) (iii) | (27) (ii) | (28) (i) | (29) (iii) | (30) (i) |
| (31) (ii) | (32) (iii) | (33) (ii) | (34) (ii) | (35) (ii) | (36) (iii) | (37) (i) | (38) (iii) | (39) (ii) | (40) (ii) |

## ප්‍රශ්න පත්‍ර අංක 03 - II පත්‍රය

(01) (I) රියෝ චං (II) නව මැදිරිය (III) ඔවුන් (IV) කෙටි ඇදපිල්ල / කෙටි ඇදය (V) ඉසිඹුව / නැඟී / හිඳගෙන / සඳහා (VI) පොත්ගුල (ලකුණු 06)

(02) (I) ✗(II) ✗(III) ✓ (ලකුණු 03)

(03) (I) කළහ. (II) වූහ (ලකුණු 02)

(04) පරිසරය කෙරෙහි දැක්වූ සංවේදීතාව වික්‍රමසිංහ මහතාගේ නිර්මාණකරණයේ සාර්ථකත්වය සඳහා ඉවහල් විය. (ලකුණු 02)

(05) (I) ෂ (II) ණ (III) ණ (IV) තා (V) ජ (VI) ඪ (ලකුණු 06)

(06) (I) අපි මල් කඩා මාල හැදුවෙමු. (ලකුණු 02)

(07) (I) වණය (II) වනය (III) නල (IV) නළ (ලකුණු 04)

(08) (I) ඇවිලෙන ගින්නට පිදුරු දැම්මා වගෙයි (II) රයිගමයයි ගම්පළයයි වගේ. (ලකුණු 02)

(09) 'සිබිල් නැන්දා' හෙවත් සිබිල් වෙත්තසිංහ මැතිණිය එදා ඒ සිහින දුටු කුඩා දැරියයි. (ලකුණු 02)

(10) (I) Shoe Flower (II) Rainbow (ලකුණු 02)

(11) Do you have a pencil ? (ලකුණු 02)

(12) ජාතික ඇඳුම (ලකුණු 01)

(13) ආච්චිලා (ලකුණු 01)

(14) එනක්කු පසික්කිරදු (ලකුණු 01)

(15) 17 019

(16) 3026, 3100, 30106

(17) 37, 41, 45, 49, 53, 57

(18) 8

(19) 1000

(20) 58

(21) 8

(22) 387

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අංශයේ ප්‍රකාශනයකි.**

**5 වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව පෙරහුරු පරීක්ෂණය 2024**

**ප්‍රශ්න පත්‍ර අංක 04 - I පත්‍රය**

**විභාග අංකය : ......................................... කාලය පැය :- 1යි.**


(01) පහත දී ඇති එක් එක් කොටුවේ අඩංගු අකුරු අතරින් නොගැළපෙන අකුරක් ඇතුළත් කොටුව තෝරන්න.


(i) ද ල ඉ උ ඤ


(ii) ඨ එ ච ඛ ඣ

(iii) ත ය ප ස ජ


(02) දී ඇති රූප අතරින් වෙනස් රූපය තෝරන්න.


(i) 


(ii) 


(iii) 

(03) පහත මුල් රූපයේ දී ඇති ගණක සංඛ්‍යාව පමණක් යොදාගෙන සෑදිය හැකි කුඩා ම සංඛ්‍යා දැක්වෙන සනක රාමුව සහිත පිළිතුර තෝරන්න.




(i) 


(ii) 


(iii) 


(04) පහත දී ඇත්තේ දිග හා පළල කොටු ඇති 1 සිට 49 තෙක් අංක ලියන ලද කොටු ජාලයකින් කපා ගන්නා ලද කොටසකි. එහි A , B , C සඳහා පිළිවෙලින් ගැළපෙන සංඛ්‍යා සහිත පිළිතුර තෝරන්න.

| | |
|---|---|
| 25 | A |
| 32 | B |
| C | 40 |

(i) 26, 27, 33

(ii) 26, 33, 39

(iii) 31, 33, 34


(05) යහළුවන් තිදෙනෙකු යම්කිසි මුදලක් එකතු කළේ පහත පරිදි ය.

- අචලා රුපියල් දහයේ කාසි
- යමුනා රුපියල් පහේ කාසි
- කමනි රුපියල් දෙකේ කාසි

එකතු වූ මුළු කාසි ගණන 27 කි. අචලා දුන් මුදල රුපියල් 70.00ක් නම් යමුනා හා කමනි දුන් කාසි ගණන පිළිවෙලින් ඇති පිළිතුර වන්නේ,

(i) 10, 7 (ii) 7, 15 (iii) 9, 11

- පහත චිත්‍රය ඇසුරින් 06 හා 07 ප්‍රශ්නවලට පිළිතුරු තෝරන්න.




(06) A හා B යන ස්ථාන දෙකේ ම සිටීමට ඉඩ ඇති සත්වයා වන්නේ,

(i) කිරලා (ii) දියකාවා (iii) පිළිහුඩුවා

(07) කුමුදු ශාකය දැකිය හැකි ස්ථානයකට අයත් ඉංග්‍රීසි අක්ෂරය වන්නේ

(i) A (ii) B (iii) C


(08) ශ්‍රව්‍ය දෘශ්‍ය සන්නිවේදන මාධ්‍යයක් නොවන්නේ මින් කුමක් ද?


(i) 


(ii) 

(iii) 


(09) පහත ඔරලෝසු මුහුණත්වල දැක්වෙන ලෙස පැය හා මිනිත්තු කටුව නිවැරදිව පිහිටා නොමැති ඔරලෝසු මුහුණත වන්නේ,

(i) 

(ii) 

(iii) 

(10) අවස්ථාව තේරුම්ගෙන වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.




(i) A B D නිවැරදිව ඇඳ ඇත

(ii) B C E රූප නිවැරදිව ඇඳ ඇත

(iii) D C A නිවැරදිව ඇඳ ඇත


(11)




A හා B නගර දෙක අතර දුර 20km කි. දිනෙත් A සිට B දෙසට පැයට කිලෝමීටර් දෙකක් ඒකාකාරී වේගයකින් ගමන් කරන අතර සිනෙත් B සිට A දෙසට පැයට කිලෝමීටර තුනක ඒකාකාර වේගයකින් ගමන් කරයි. දෙදෙනාම ගමන ආරම්භ කළේ පෙ.ව. 7.00 ට නම් ඔවුන් දෙදෙනා එකට හමුවන වේලාව සහ ඒ වන විට සිනෙත් ගමන්කර තිබූ දුර වනුයේ,

(i) පෙ.ව. 11.00, 12km (ii) පෙ.ව. 11.00, 8km (iii) පෙ.ව. 10.00, 9km

(12) පහත සඳහන් වෘත්තය කොටස් කීපයකට බෙදා ඇත. එම එක් එක් කොටස් සඳහා වර්ණ යොදා ඇත. එක ළඟ තිබෙන කොටස් දෙකක් එකම පාටින් යුක්ත නොවන පරිදි පාට කර දැක්වීමට A හා B කොටස් දෙකට පිළිවෙළින් වඩාත් ගැළපෙන වර්ණ දෙක තෝරන්න.





(i) රතු හා නිල්


(ii) දම් හා කහ


(iii) කොළ හා කහ


(13) හිස්තැනට වඩාත් ගැළපෙන රූපය තෝරන්න.



..................................................

(i) 

(ii) 

(iii) 

(14) පහත දී ඇති ප්‍රකාශ අතුරින් වැරදි ප්‍රකාශය වන්නේ,

(i) ඔත්තේ සංඛ්‍යාවක් තවත් ඔත්තේ සංඛ්‍යාවකින් ගුණකළ විට පිළිතුර ඔත්තේ සංඛ්‍යාවකි.


(ii) ඉරට්ටේ සංඛ්‍යා දෙකක් එකතු කළ විට පිළිතුර ඉරට්ටේ සංඛ්‍යාවකි.


(iii) ඔත්තේ සංඛ්‍යා දෙකක් එකතු කළ විට පිළිතුර ඔත්තේ සංඛ්‍යාවකි.

(15) සෙනුලි සහ අනුෂි යන දෙදෙනාම ළඟ ඇති මුදල දිනුමි ළඟ ඇති මුදලට සමාන වේ. සෙනුලි ළඟ ඇති මුදල මෙන් තුන් ගුණයක් අනුෂි ළඟ ඇත. ඉහත තොරතුරු නිවැරදිව දක්වා ඇති රූපය වන්නේ,


(i)





(ii)



(iii)



(16) එළවළු, පලතුරු, අඹ, පොල් අතර සම්බන්ධතාවය වඩාත් හොඳින් විස්තර කෙරෙන රූපය වන්නේ,


(i)



(ii)



(iii)


(17) කොටුවෙහි අඳුරු නොකළ සම්පූර්ණ කිරීම සඳහා වඩාත් සුදුසු කොටස් සහිත පිළිතුර වන්නේ,



(i)


(ii)


(iii)



(18) 2019 වර්ෂයේ ජනවාරි පළමුවෙනිදා බදාදා දවසකි. ඒ අනුව 2020 වර්ෂය පිළිබඳ නිවැරදි ප්‍රකාශය වන්නේ,


(i) 2020 වර්ෂයේ ජනවාරි 01 බ්‍රහස්පතින්දා වන අතර දෙසැම්බර් 31 බ්‍රහස්පතින්දා දවසකි.


(ii) 2020 වර්ෂයේ ජනවාරි 01 බ්‍රහස්පතින්දා වන අතර දෙසැම්බර් 31 සිකුරාදා දවසකි.

(iii) 2020 වර්ෂයේ ජනවාරි 01 සිකුරාදා දිනයක් වන අතර දෙසැම්බර් 31 බ්‍රහස්පතින්දා දිනයකි.

(19) රටාව අනුව හිස් කොටුවට ගැළපෙන සංඛ්‍යාව වනුයේ,








(i) 2

(ii) 8

(iii) 4

(20) ගණක 12 ක් පමණක් භාවිතා කර පහත සඳහන් ගණක රාමුවේ නිරූපණය කළ හැකි විශාලම සංඛ්‍යාව වනුයේ,






(i) 930


(ii) 921

(iii) 999

(21) මුහුණ බලන කණ්ණාඩියකින් බැලූ විට ඒ ආකාරයෙන් ම නොපෙනෙන රූපය වන්නේ,

(i)



(ii)



(iii)



(22) පේළියක ගයාන් ට ඉදිරියෙන් යාබදව සපුනි සිටියි. ගයාන් පිටුපසින් තවත් ළමයි 8ක් සිටිති. සපුනි පේළියේ හරිමැද සිටින ළමයා ය. එසේ නම් පේළියේ සිටින මුළු ළමුන් ගණන කීය ද?

(i) 19 කි (ii) 20 කි (iii) 18 කි


(23) වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(i) ලේනා ශාක භක්ෂක සතෙක්වන අතර ඌ කිරි බී වැඩෙයි




(ii) ශාක භක්ෂක සියලුම සතුන්ට පාද හතරක් පිහිටා ඇත

(iii) සියලුම කෘමි සතුන් මල්පැණි හෝ සතුන්ගේ ලේ උරා බී වැඩෙන සතුන් නොවේ

(24) මුහුණත්වල අය ලකුණු කරන ලද එක ම ඝනකයක අවස්ථා 4ක් පහත දැක්වේ.





•  ට විරුද්ධ පැත්තේ ඇති අය ගණන සහිත පිළිතුර තෝරන්න


(i)  (ii)  (iii) 

• දී ඇති රටාව තේරුම් ගෙන 25, 26 ප්‍රශ්නවල හිස්තැනට ගැළපෙන පිළිතුර තෝරන්න.

(25)













(i) 8 (ii) 6 (iii) 4

(26)





(i) 40 (ii) 15 (iii) 30

(27) සියලුම කොටස් සමානව සකස් කර ඇති A හා B පුවරු දෙකක් ඇත. ඒවා සමානව කොටස් අටකට බෙදා A B C D E F G H යනුවෙන් නම් කර ඇත. A පුවරුව වට එකක් කරකවා නිශ්චල කොට B පුවරුව වට බාගයක් කරකවා නිශ්චල කොට පසුව පුවරු දෙක ම එක මත තබයි. (පුවරු දෙක ම වම් පැත්තට කරකවයි) එවිට පිළිවෙළින් H හා පිහිටන අකුර කුමක් ද?

(i) C (ii) D (iii) G

(28) මා ළඟ පාට කිහිපයක පැන්සල් ඇති අතර රතු පැන්සල් ද සුදු පැන්සල් 2ක් ද, කහ සහ රතු පැන්සල්වලට සමාන ප්‍රමාණයක් නිල් පැන්සල් ද, සුදු පැන්සල් මෙන් දෙගුණයක් කහ පැන්සල් ද, මුළු පැන්සල්වලින් බාගයක් නිල් පැන්සල් ද ඇත. මා ලඟ ඇති මුළු පැන්සල් ගණන 22ක් නම් මා ලඟ ඇති රතු පැන්සල් ගණන කීය ද?

(i) 5 (ii) 7 (iii) 9

• 


දී ඇති ජල ටැංකියේ ධාරිතාව 180$l$ කි. එහි B හා C නල දෙක වසා A නලය විවෘත කළ විට මිනිත්තු එකකට ලීටර 20ක් ජලය පිරෙයි. මෙහි B හා C නල විවෘත කළ විට B නලයෙන් මිනිත්තු එකකට ලීටර 5 කුත් C නලයෙන් මිනිත්තුවකට ලීටර 10 කුත් ටැංකියෙන් ඉවත් වේ. (B නලය යොදා ඇත්තේ ටැංකියේ හරි මැදින් වේ.) ඒ අනුව 29 හා 30 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(29) A හා B නල දෙක පමණක් එකවර විවෘත කළ විට ටැංකිය මුලින් ම පිරී යැමට ගතවන කාලය කොපමණ ද?

(i) මිනිත්තු 18 කි (ii) මිනිත්තු 16 කි (iii) මිනිත්තු 12 කි

(30) ටැංකිය සම්පූර්ණයෙන් ම ජලයෙන් පුරවා A නලය වසා B හා C නල දෙකම එකවර විවෘත කළ විට ජලය සම්පූර්ණ ඉවත් වීමට ගතවන කාලය කොපමණ ද?

(i) මිනිත්තු 27 කි (ii) මිනිත්තු 12 කි (iii) මිනිත්තු 18 කි

(31) 


ඉහත රූපයේ අඳුරු කර ඇති කොටස මුළු රූපයෙන්,

(i) බාගයකට වඩා වැඩිය

(ii) බාගයකට සමානය

(iii) බාගයකට වඩා අඩුය


(32) දී ඇති රූපයේ දැක්වෙන්නේ සමචතුරස්‍රාකාර මුහුණත් දෙකක් හා පළල මෙන් දිග දෙගුණයක් වූ සෘජුකෝණාස්‍රාකාර මුහුණත් හතරක් සහිත ඝනකාභ හැඩැති තෑගි පාර්සලයකි. එහි සමචතුරස්‍රාකාර මුහුණත පැත්තක දිග 30 cm කි. එය රූපයේ පරිදි රිබන් පටියකින් වටේ සැකසීමට අවශ්‍ය රිබන් පටියේ අවම දිග කොපමණ ද?



(i) 240 cm

(ii) 300 cm

(iii) 360 cm

(33) 


දී ඇති සමචතුරස්‍රාකාර කඩදාසි 1 හා 2 ඊතලවලින් පෙන්වා ඇති පරිදි කඩ ඉරිවලින් දෙකට නවා තිත් ඉරිවලින් වෙන් වන පරිදි කැපූ විට ලැබෙන කොටස් පිළිබඳ කිව හැක්කේ,

(i) සමචතුරස්‍රාකාර හා සෘජුකෝණාස්‍රාකාර කොටස් සමාන ප්‍රමාණයක් ලැබේ

(ii) එකිනෙකට සමාන සමචතුරස්‍රාකාර කොටස් පහක් ලැබේ

(iii) සෘජුකෝණාස්‍රාකාර හතරක් සහ සමචතුරස්‍රාකාර පහක් ලැබේ

- දී ඇති තොරතුරු ඇසුරින් 34 හා 35 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

- වාර විභාගයකදී සිංහල විෂය සඳහා පවනිට වඩා සවනි ලකුණු 10ක් ලබාගත් අතර රනුක ලකුණු 52ක් ලබා ගන්නා ලදී. විශ්ව පවනිට වඩා ලකුණු 17ක් ලබාගෙන තිබූ අතර ඔහු රනුකට වඩා ලකුණු 25ක් වැඩි විය.

(34) සිංහල විෂය සඳහා සවනි ලබාගත් ලකුණු ප්‍රමාණය කොපමණ ද?

(i) 67 (ii) 72 (iii) 70

(35) විශ්ව හා සවනි ලබාගත් ලකුණු අතර වෙනස කීය ද?

(i) 7 (ii) 17 (iii) 15

- දී ඇති කවිය ඇසුරින් 36, 37 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ඇසී නාද හඬ බඹරුගෙ ලීලා
පැසී ගොයම් පත් කිරට නැමීලා
ගැසී සුළං වාතෙට ඉති නැමීලා
පැසී ගොයම් පත් සුරපුර ලීලා


(36) මෙහි කෙටි ඇඳය යෙදී ඇති වාර ගණන කීය ද?

(i) 7 (ii) 6 (iii) 5

(37) සඤ්ඤක අකුරක් යෙදී නොමැති වචනය තෝරන්න

(i) හඬ (ii) සුළං (iii) බඹරුගෙ

(38) දී ඇති රූපයේ දැකිය හැකි ත්‍රිකෝණ ගණන කීය ද?



(i) 0

(ii) 4


(iii) 8

(39) හිස් තැනට සුදුසු වචනය තෝරා යටින් ඉරක් අඳින්න

- පොල් → කුරුම්බා නම්
- කොස් → ........................

(i) වරකා (ii) හෙරලිය (iii) පොළොස්

(40) දී ඇති ඝනකයේ තිත් ඉරි දිගේ කොටස් දෙකකට වෙන් වන සේ කැපූ විට කැපුම් මුහුණතේ හැඩය,



(i) සමචතුරස්‍රාකාරය

(ii) සෘජුකෝණාස්‍රාකාරය

(iii) ත්‍රිකෝණාකාරය

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අංශයේ ප්‍රකාශනයකි.**

**5 වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව පෙරහුරු පරීක්ෂණය 2024**

**ප්‍රශ්න පත්‍ර අංක 04 - II පත්‍රය**

**විභාග අංකය : ............................... කාලය පැය :- 1 යි මිනිත්තු 15 යි.**

(01) පහත සඳහන් කවි පෙළ කියවා අසා ඇති ප්‍රශ්නවලට කවි පෙළ ඇසුරෙන් පිළිතුරු සපයන්න.

වෙරළ වටා මුතුපර වැටීයයි
ඉන්දිය සයුරේ මුතු ඇටයයි
පාට පාට මැණික් ජාති
පසට යටින් කැටි වේ
රත්නදීප පොළොව තුළින්
ධන නිධාන මතු වේ
මහවැලි නිල්වලා ගඟයි
කළු වලවේ කැලණි ගඟයි
ගමින් ගමට ගලා ගොසින්
ගොඩයි මඩයි පොහොර කරයි
පලා පැහැය හැම කල්හි ම
රැඳී දිලෙන පොළොවේ
ඉවත දමන දඬුව වුව ද
දලු ලා යළි පැළ වේ......

සරු පොළොවක් අපට ඇතේ-
මහගම සේකර.

(i) මෙම කවි පෙළෙන් ශ්‍රී ලංකාව හඳුන්වන්නේ කෙසේ ද? ...............................................................

(ii) පසට යටින් ඇත්තේ මොනවා ද? ...............................................................

(iii) මෙහි සඳහන් නැගෙනහිර පළාතෙන් මුහුදට වැටෙන ගඟ කුමක් ද? ...............................................................

(iv) ''ඔ'' ශබ්දය සහිත පිල්ලම දෙවරක් යෙදී ඇති වචනයක් සොයා ලියන්න. ...............................................................

(v) අප්‍රාණවාචී බහුවචන නාම පදයක් ලියන්න. ...............................................................

(vi) ඉතාමත් සරු පසක් ඇති බව හැඟවෙන කවි පද තෝරා ලියන්න.

...............................................................

...............................................................

(vii) කොළ පාට මෙහි දක්වා ඇත්තේ කෙසේ ද? ...............................................................

(02) දී ඇති වචනවල අක්ෂර වින්‍යාසය වැරදිය. එය නිවැරදි කර ලියන්න.

(i) අදිශ්ටානය = ...................................

(ii) පච්රානික = ...................................

(03) පද ගළපා වාක්‍ය නිවැරදිව සකස්කර ලියන්න.

- දෙන්නට / පාන් / නිමල්ට / බොහෝ / කළේ ය / සුනිල් / පෙත්තක් / පෙරැත්ත.

....................................................................................................................................................

(04) වැකියට සුදුසු විරාම ලකුණු යොදන්න. එම විරාම ලකුණු නම් කරන්න.

(i) එහි විස්කෝතු පෙට්ටි කේක් කෙසෙල් ගෙඩි ආදිය තිබුණි

....................................................................................................................................................

(ii) ගුරුතුමිය අපේ ගම පොතේ පිටුවක් පෙරලා කවීෂාට දුන්නා ය.

....................................................................................................................................................

(05) දී ඇති වැකියේ ඉරි ඇඳි පදයට විරුද්ධාර්ථ පදය යොදා වාක්‍ය නැවත ලියන්න.

- ඔහු යහපත් අයෙකු බව සියලු දෙනා පැවසූහ.

....................................................................................................................................................

(06) ස්ත්‍රී ලිංග ඒකවචන වාක්‍යයක් ලෙස සකස්කර ලියන්න.

- ඔවුහු දිය නෑම සඳහා ගඟට පැමිණියෝ ය.

....................................................................................................................................................

(07) (i) පහත සඳහන් ප්‍රස්තාව පිරුළ සම්පූර්ණ කරන්න.

- ........................ නිසා ඉබ්බා .............................. වගේ.

(ii) පහත දැක්වෙන අවස්ථාවේ දී පැවසිය හැකි ඉඟි වැකිය ලියන්න.

- තමාට පැවරුණු වගකීමකින් බේරීමේ දී

....................................................................................................................................................

(08) දී ඇති වාක්‍යවල උක්තආඛ්‍යාත සම්බන්ධය නිවැරදි නම් "✓" ලකුණ ද වැරදි නම් "✗" ලකුණ ද වරහන් තුළ යොදන්න.

(i) ඈත අහසේ කුරුල්ලන් ඉගිලෙති. (.........)

(ii) ගස්වල මල් පිපී සුවඳ හමයි. (.........)

(iii) මා උදෑසන ම අවදි වී මුහුණ සේදුවෙමි. (.........)


(iv) ළමයි දිනපතා පාසල් යයි. (.........)

(09) පහත දී ඇති ජන කවිය සම්පූර්ණ කරන්න.

පෙර කලේ තැනූ පැල දැන් දිරාලා
එම කලේ බැඳපු වැට ගොනු කඩාලා
පැල්පතේ ගොයම් රෑ රැක බලාලා
.........................................................................

(10) පහත රූපවලට ගැළපෙන ඉංග්‍රීසි වචනය, ඉංග්‍රීසි අකුරුවලින් ලියන්න.





(i) ...................................... (ii) ......................................

(11) (i) හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.

- I .......................... (has / have) one sister.

(ii) අදහස සිංහලෙන් ලියන්න.

- Draw two cats ..............................................................................................................

(12) වචන ගළපා වාක්‍ය නිවැරදිව සකස් කරන්න.

- Vegetable? / is / What / this

.....................................................................................................................................

(13) පහත වචනයේ සහ වැකියේ සිංහල අර්ථය ලියන්න.

(i) වහප්පු = ......................................................................................................................

(ii) ආම් එනක්කු තණ්ණීර් වේණ්ඩුම් = ...........................................................................................

(14) මෙම වාක්‍ය දෙමළෙන් කියන ආකාරය සිංහල අකුරෙන් ලියන්න.

- අඩිරූල තිබෙනවා

.....................................................................................................................................

(15) දී ඇති සංඛ්‍යාව අකුරෙන් ලියන්න.

- 90 901 = ......................................................................................................................

(16) 4989 ත් 4991 ත් අතර සංඛ්‍යාව කුමක් ද? ..................................................................................

(17) හිස්තැන් පුරවන්න.

(i) $2l$ 75m$l$ = ............................ m$l$


(ii) .............. Kg .............. g = 10100 g

(18) රාක්කයක පොත් ඇසිරීමේ දී සිංහල, ගණිතය, විද්‍යාව යන පිළිවෙලට පොත් අසුරා ඇත. 8 වෙනි ගණිතය පොත අසුරා ඇත්තේ කී වෙනියට ද? ..................................................

(19) ඇපල් ගෙඩි 44 කින් 2/4ක් කොපමණ ද? ..........................................

(20) මල් පෙති 90ක් ගෙන සමාන පෙති ප්‍රමාණයක් අමුණා මල් 10ක් සෑදුවේ නම් මල් 6කට ඇමුණු මල් පෙති ගණන කීය ද? ..............................................

(21) දී ඇති රූපයේ 0.3ක කොටසක් පාට කරන්න.



(22) නංගී ළඟ සියඹලා ඇට 7ක් ඇත. මල්ලී ළඟ සියඹලා ඇට 4 කි. අක්කා ළඟ සියඹලා ඇට 5ක් ඇත. තිදෙනා ළඟම ඇති සියඹලා ඇට ගණන රෝම ඉලක්කමෙන් ලියන්න. ......................................................

(23) ගසක තිබූ අඹ ගෙඩිවලින් ගෙඩි 301ක් කඩන ලදී. ගසේ ඉතිරි වූ අඹ ගෙඩි ගණන 975 කි. එම අඹ ගසේ මුලින් තිබූ මුළු අඹ ගෙඩි ගණන කීය ද? ................................................

(24) විශාල වත්තක ඇති ගස් ගණන 5469 කි. එයින් 2386ක් මහෝගනී ගස් ය. ඉතිරි ගස් වෙනත් වර්ගවල ඒවා ය. මහෝගනී ගස් හා වෙනත් ගස් අතර වෙනස කීය ද? ...................................................................................

(25) ලීටර 6 කට ඇති මිලි ලීටර 250 ඒවා ගණන කීය ද? .................................................................................

(26) මධ්‍යම රාත්‍රී 12.00 පසු වී මිනිත්තු 30ක් ගත වූ පසු වේලාව සම්මත ආකාරයෙන් දක්වන්න. ........................

(27) ළමයෙක් පෙ.ව. 8.00 ට උතුරට හැරී සිටියි. ඉර පායා ඇත්තේ ඔහුගේ කුමන අත පැත්තෙන් ද?
............................................

(28) පහත වගුවේ දක්වා ඇත්තේ එක්තරා පවුලක සාමාජිකයන්ගේ උපන් දිනයන් ය. ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

| නම | උපන් දිනය |
|---|---|
| නිර්මලා | 1975-12-08 |
| ප්‍රියානි | 1998-05-03 |
| කීර්ති | 1973-02-01 |
| ප්‍රබෝධ | 2002-07-05 |

(i) වයසින් අඩුම තැනැත්තා කවු ද? ...........................................................................................

(ii) වයසින් අඩුම කෙනාගේ සිට වැඩි ම කෙනා තෙක් පිළිවෙළින් නම් ලියන්න.

.................................................................................................................................

(iii) වයසින් වැඩිම තැනැත්තා හා අඩුම තැනැත්තාගේ වයස්වල වෙනස කොපමණ ද? ..........................

(29) නිශාන් තේ කොළ 100gක් මිල දී ගෙන රුපියල් 200ක් මුදලාලිට දුන් පසු නැවත රුපියල් 50ක මුදලක් ඔහුට ඉතිරි ලැබුණි. ඔහු එම තේ කොළ 1 Kgක් මිල දී ගත්තේ නම් ගෙවිය යුතු මිල කීය ද? .......................

- **අංක 30 සිට 59 තෙක් ප්‍රශ්නවලට සුදුසු පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.**

(30) පොදු ස්ථානයක් ඇතුළත්කර නොමැති පේළිය තෝරන්න.

(1) පුස්තකාලය, පොදු වැසිකිළිය, බැංකුව

(2) රෝහල, බස් නැවතුම, නිවස

(3) මහාමාර්ගය, පොදු වෙළඳපොළ, පාසල

(31) ජාතික කොඩිය ඔසවන අවස්ථාවක් නොවේ.

(1) පාසලේ උදෑසන රැස්වීම

(2) විවාහ මංගල උත්සවයක්

(3) නිදහස් උත්සවය

(32) 1815 හා 1948 යන වර්ෂවල විශේෂත්වය පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,

(1) අපේ රටට නිදහස ලැබීම - පෘතුගීසීන් ලංකාවට පැමිණීම

(2) ශ්‍රී ලංකාව යටත් විජිතයක් බවට පත් වීම - ඉංග්‍රීසීන් රට පාලනය කිරීම

(3) ශ්‍රී ලංකාව යටත් විජිතයක් බවට පත්වීම - ලංකාවට නිදහස ලැබීම

(33) ''මේ සිංහල අපගෙ රටයි. අප ඉපදෙන මැරෙන රටයි.'' මෙම ගීතය ගායනා කරන්නේ,

(1) නන්දා මාලනී මහත්මිය

(2) ඩබ්ලිව්.ඩී. අමරදේව මහතා

(3) සුනිල් ශාන්ත මහතා

(34) මලක කොටසක් නොවේ.

(1) නටුව (2) රේණු (3) පැණි පත්‍ර

(35) වැරදි ප්‍රකාශය තෝරන්න.

(1) සතුන් හා ශාක අතර සමීප සම්බන්ධතාවක් ඇත.

(2) සතුන්ගේ බොහෝ අවශ්‍යතා සපුරන්නේ ශාකය.

(3) ශාකවල වර්ධනයට අවශ්‍ය ප්‍රධාන සාධකයකි සතුන්.

(36) ඖෂධ සඳහා ''පොතු'' ලබා ගන්නා ශාකයකි.

(1) සැවැන්දරා (2) පාවට්ටා (3) රණවරා

(37) පෙදරේරු කර්මාන්තයෙන් සිදු වන සේවයකි.

(1) නිවාස තනා දීම

(2) නිවසට අවශ්‍ය උපකරණ සැකසීම

(3) නිවසට අවශ්‍ය ආහාර සපයා දීම

(38) ලේන්සුවක වටේ මැසීමට හා මලක් මසා ගැනීමට යොදා ගත හැකි මැහුම් ක්‍රම පිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ,

(1) බ්ලැන්කට් මැස්ම - වාටි මැස්ම

(2) දම්වැල් මැස්ම - බ්ලැන්කට් මැස්ම

(3) බ්ලැන්කට් මැස්ම - දම්වැල් මැස්ම

(39) වැලියට දැමීමෙන් කල් තබා ගත හැකිය.

(1) ගොරකා, දෙහි (2) දෙහි, කොස් ඇට (3) සියඹලා, ගොරකා

(40) නාය යෑම් බහුලව සිදු වන්නේ,

(1) මුහුදුබඩ ප්‍රදේශයේ (2) කඳුකර ප්‍රදේශයේ (3) තැනිතලා ප්‍රදේශවල

(41) නිල ඇඳුමක් අඳින වෘත්තියක යෙදෙන්නෙකි.

(1) කම්මල්කරුවා (2) කරණවෑමියා (3) මහජන සෞඛ්‍ය පරීක්ෂක

(42) ස්වාභාවික අනතුරක් නොවේ.

(1) ගංවතුර (2) අකුණුසැර වැදීම (3) විදුලිසැර වැදීම

(43) පිළිවෙළින් පළා වර්ගයක්, ධාන්‍ය වර්ගයක්, මාංශ භෝගයක් සඳහන්වන පිළිතුර තෝරන්න.

(1) මුකුණුවැන්න, කුරහන්, මාළු

(2) ගොටුකොළ, සහල්, පරිප්පු

(3) මුං ඇට, මුකුණුවැන්න, කඩල

(44) රෝග වාහක පුද්ගලයෙක් මගින් බෝවන රෝගයකි.

(1) සරම්ප (2) පාචනය (3) බරවා

(45) | S N | | N S |

- ඉහත දක්වා ඇති චුම්භක දෙක ළං කළවිට,

(1) ආකර්ෂණය වේ (2) විකර්ෂණය වේ (3) කිසිවක් සිදු නොවේ

(46) 'කිරල' ශාකය දැකිය හැකි වන්නේ,

(1) වියළි කලාපයේ (2) කඳුකර ප්‍රදේශවල (3) කඩොලාන පරිසරවල

(47) ''1877 අගෝස්තු 22 වෙනි දින උපත ලැබීය. ශාස්ත්‍රීය ග්‍රන්ථ හා නිබන්ධන 500 ට වැඩි ප්‍රමාණයක් රචනා කර ඇත. 1905 දී 'ලංකා සමාජ ප්‍රතිසංස්කරණ සංගමය' අරඹන ලදී.

- මෙහි විස්තර වන්නේ කවුරුන් ගැන ද?

(1) ආචාර්ය ටී.බී. ජයා මහතා


(2) ආචාර්ය ආනන්ද කුමාර ස්වාමි මැතිතුමා


(3) ආතර් සී. ක්ලාක් මැතිතුමා

(48) දිස්ත්‍රික්කයක් නොවේ.

(1) කෑගල්ල (2) බදුල්ල (3) මීනුවන්ගොඩ

(49) ධන (+) හා සෘණ (-) අග්‍ර නිවැරදි ව දක්වා ඇති වියළි කෝෂය තෝරන්න.

(1) 

(2) 

(3) 


(50) ශරීර වර්ධනය සඳහා ලබා ගත යුතු ආහාරයකි.

(1) එළවළු (2) මාළු (3) බත්

(51) වැව්, පොකුණු, ගංගාවල ඇත්තේ,

(1) මිරිදිය (2) කරදිය (3) බාදිය

(52) පිළිස්සුණු අවස්ථාවක අප නොකළ යුත්තේ,

(1) පිළිස්සුණු ස්ථානයට ගලා යන සේ ජලය දැමීම

(2) අත් බෙහෙත් තුවාලය මත ආලේප කිරීම

(3) අවශ්‍ය නම් වෛද්‍යවරයෙක් වෙත යාම

(53) එදිනෙදා භාවිත කරන උපකරණ ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා බලශක්ති 2කි.

(1) පෙට්‍රල් - ගල් අඟුරු (2) ජලය - ඖෂධ (3) හිරු එළිය - සඳ එළිය

(54) වෙස් මුහුණු සකස් කිරීමට ගන්නා ලී වර්ගයකි.

(1) කොස් (2) තේක්ක (3) කදුරු

(55) 

- මෙම රූපයෙන් දැක්වෙන්නේ,

(1) මොනරවිල කැප්පෙටිපොළ

(2) ගොංගාලේගොඩ බණ්ඩා

(3) වීර පුරන්අප්පු

(56) සමහර සතුන්ට සමේ වර්ණය වෙනස්කර ගැනීමේ හැකියාව ඇත. උන් එලෙස සිදුකරනු ලබන්නේ,

(1) අලංකාරය පිණිස

(2) අන් අය සතුටු කිරීමට

(3) ආරක්ෂාව පිණිස

(57) වාරි කර්මාන්තය දියුණු කිරීමෙන් ලැබෙන ප්‍රයෝජනයකි.

(1) කෘෂිකර්මය නගා සිටුවීමට හැකි වීම

(2) විදේශ ආධාර ලබා ගත හැකි වීම

(3) ධීවර කර්මාන්තය දියුණු වීම

(58) නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) බොහෝ අනුකරණ වෙළෙඳ භාණ්ඩ නියමිත ප්‍රමිතයෙන් හා ගුණාත්මක භාවයෙන් යුතුය.

(2) අනුකරණවලින් තොර විෂ ද්‍රව්‍ය නොයෙදූ පිරිසිදු භාණ්ඩ හා ද්‍රව්‍ය ලබා ගැනීමට පාරිභෝගිකයාට අයිතියක් ඇත.

(3) භාණ්ඩ විකිණීම සඳහා ගුවන් විදුලිය, රූපවාහිනිය, පුවත්පත් මගින් ප්‍රචාරයවන තොරතුරු සත්‍ය වේ.

(59) ''ඒප්‍රන'' භාවිත කරන්නේ,

(1) ආහාර පිළියෙල කරනවිට

(2) ආහාර අනුභව කරනවිට

(3) ගොයම් කපනවිට

(60) ''හිරු බැස යයි - සඳ නැග එයි' ටික වේලාවකින් අහස වැහි වලාකුළුවලින් පිරී යන්නට විය. යන මාතෘකාව යටතේ නිර්මාණාත්මක වැකි 3ක් ලියන්න. එක් වගන්තියකට වචන 5කට වැඩි විය යුතුය. උක්ත ආඛ්‍යාත සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතුය.

(1) ..........................................................................................................................................

..........................................................................................................................................

(2) ..........................................................................................................................................

..........................................................................................................................................

(3) ..........................................................................................................................................

..........................................................................................................................................

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අංශයේ ප්‍රකාශනයකි.**

**5 වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව පෙරහුරු පරීක්ෂණය 2024**

**පිළිතුරු**

## ප්‍රශ්න පත්‍ර අංක 04 - I පත්‍රය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| (01) (iii) | (02) (iii) | (03) (ii) | (04) (ii) | (05) (iii) | (06) (ii) | (07) (iii) | (08) (iii) | (09) (i) | (10) (ii) |
| (11) (ii) | (12) (ii) | (13) (iii) | (14) (iii) | (15) (ii) | (16) (ii) | (17) (ii) | (18) (ii) | (19) (iii) | (20) (i) |
| (21) (ii) | (22) (i) | (23) (iii) | (24) (ii) | (25) (i) | (26) (iii) | (27) (iii) | (28) (i) | (29) (iii) | (30) (ii) |
| (31) (ii) | (32) (i) | (33) (iii) | (34) (iii) | (35) (i) | (36) (ii) | (37) (ii) | (38) (i) | (39) (iii) | (40) (ii) |

## ප්‍රශ්න පත්‍ර අංක 04 - II පත්‍රය

(01) (i) ඉන්දීය සයුරේ මුතුඇටය (ii) පාට පාට මැණික් ජාති (iii) මහවැලි ගඟ (iv) පොළොවේ (v) මැණික් / නිධාන (vi) ඉවත දමන දඬුව වුව ද - දලු ලා යළි පැළ වේ. (vii) කොළ පාට (02) (i) අධිෂ්ඨානය (ii) පෞරාණික (03) නිමල්ට පාන් පෙත්තක් දෙන්නට සුනිල් බොහෝ පෙරැත්ත කළේ ය. (04) (i) එහි විස්කෝතු පෙට්ටි, කේක්, කෙසෙල් ගෙඩි ආදිය තිබුණි. (ii) ගුරුතුමිය 'අපේ ගම' පොතේ පිටුවක් පෙරලා කවීෂාට දුන්නා ය. (05) ඔහු <u>අයහපත්</u> අයෙකු බව සියලු දෙනා පැවසූහ. (06) ඇය දිය නෑම සඳහා ගඟට පැමිණියා ය. (07) (i) <u>කට</u> නිසා ඉබ්බා <u>නැහුණා</u> වගේ. (ii) ඇඟ බේරා ගන්නවා. (08) (i) - × (ii) - ✓ (iii) - × (iv) - × (09) නිදිමතේ කියමි පැල් කවි ගොතාලා. (10) (i) window (ii) Circle (11) (i) have (ii) පූසන් දෙන්නෙක් අඳින්න. (12) What is this vegetable? (13) (i) පන්තිය (ii) ඔව් මට වතුර ඕනා (14) අඩිමට්ටම් ඉරුක්කිරදු (15) අනූදහස් නවසිය එක (16) 4990 (17) (i) 2075m$l$ (ii) 10kg 100g (18) 23 (19) 22 (20) 54 (21) කොටු 3ක් පාට කළ යුතුයි. (22) xvi (23) 1276 (24) 3083 (25) 24 (26) 00:30 (27) දකුණු අත (28) (i) - ප්‍රබෝධ (ii) - ප්‍රබෝධ, ප්‍රියානි, නිර්මලා, කීර්ති. (29) රුපියල් 1500 (30) 2 (31) 2 (32) 3 (33) 1 (34) 3 (35) 3 (36) 2 (37) 1 (38) 3 (39) 2 (40) 2 (41) 3 (42) 3 (43) 2 (44) 1 (45) 2 (46) 3 (47) 2 (48) 3 (49) 3 (50) 2 (51) 1 (52) 2 (53) 1 (54) 3 (55) 2 (56) 3 (57) 1 (58) 2 (59) 1 (60) නිර්මාණාත්මකව, නිවැරදිව ඇත්නම් ලකුණු ලබා දෙන්න. අතිරේක ලකුණු 01

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අංශයේ ප්‍රකාශනයකි.**

**5 වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව පෙරහුරු පරීක්ෂණය 2024**

**ප්‍රශ්න පත්‍ර අංක 05 - I පත්‍රය**

**විභාග අංකය : ........................................ කාලය පැය :- 1යි.**


- පින්තූරය වඩාත් හොඳින් අර්ථවත් වන වචන අඩංගු පිළිතුර තෝරන්න.


(01) 


(i) මාංශ භක්ෂක, සිවුපා, වනය
(ii) සුරතල්, විනෝදය, නිර්මාංශ
(iii) ආරක්ෂාව, ගෘහාශ්‍රිත, සර්ව භක්ෂක

- වෙනස් රූපය තෝරන්න.


(02)



(i)



(ii)


(iii)

(03)


(i)


(ii)


(iii)

- පහත දී ඇති කවිය ඇසුරෙන් ගැළපෙන පිළිතුර තෝරන්න. (ප්‍රශ්න අංක (04) , (05) සඳහා)

පාට ඇතත් - සුවඳ නැතත්
මලක් වුණත් - පලක් නැහැ
ළමයෝ නුඹත් - නරක් වුණොත්
සුවඳක් නැති - මල වගේ ය.

(04) මලකින් පලක් නැතිවන්නේ ඇයි?


(i) නරක් වීම නිසා (ii) සුවඳ නැති මලක් විම නිසා (iii) පාට නැති මලක් වීම නිසා

(05) සුවඳ නැති මලක් වන්නේ කවුද?

(i) නරක ළමයා (ii) දරුවා (iii) හොඳ ළමයා

- **පහත රූප සටහන අනුව හිස් කොටුවට ගැළපෙන රූපය තෝරන්න.**

(06)




(i)  (ii)  (iii) 

(07) නිලීකාගේ දුව සකුන්තලා ය. සුමිත්ගේ දුව රුවන්ති ය. සුගත් රුවන්තිගේ මල්ලී ය. නිලීකාගේ මව වන අජන්තා රුවන්තිගේ තාත්තාගේ අම්මා ය. මේ තොරතුරු අනුව, නිලීකා සුගත්ගේ කවුරුන් ද?

(i) නැන්දා (ii) ලොකු අම්මා (iii) පුංචි අම්මා

(08) විස්තරයට අනුව අජන්තාට සිටින දරුවන් ගණන කීය ද?


(i) 4 (ii) 6 (iii) 2

(09) බෑගයක පාට තුනකින් ලේන්සු තිබුණි. එහි තිබූ රතු ලේන්සු ගණන 4ක් සහ නිල් ලේන්සු දෙකක් ඉවතට ගත්විට ඉතිරි නිල් ලේන්සු ගණන කොළ පාට ලේන්සු ගණනට සමාන වූ අතර රතු ලේන්සු ගණන කොළ පාට ලේන්සු ගණන මෙන් දෙගුණයක් විය. එහි තිබූ කොළ පාට ලේන්සු ගණන 6ක් නම් බෑගයේ මුලින් ම තිබූ ලේන්සු ගණන කීය ද?

(i) 29 (ii) 32 (iii) 30

- **පහත දැක්වෙන රූපසටහන් උපයෝගී කරගෙන පිළිතුරු සපයන්න.**

(10) එක් කාණ්ඩයකට අයත් පිළිතුර තෝරන්න.



A B C D E F

(i) ABC DFE (ii) ACD EBF (iii) ADE BCF

- **සම්බන්ධතාවයක් දැකිය නොහැකි වචන අඩංගු රවුම තෝරන්න.**

(11) (i) මිලි මීටර්, සෙන්ටිමීටර්, මිලි ලීටර්

(ii) අයිස්, ජලය, හුමාලය

(iii) තත්පර, පැය, මිනිත්තු

(12) (i) වික්ටෝරියා, රන්ටැඹේ, කොත්මලේ, ගල්ඔය

(ii) සමනල, වලවේ, කළු, මහවැලි

(iii) ශ්‍රී ලංකාව, පාකිස්තානය, ඉන්දියාව, භූතානය

- **මෙම ප්‍රකාශයන්ට ගැළපෙන යෙදුම තෝරන්න.**


(13) ප්‍රයෝජනයක් නැති වැඩක් සඳහා වෙහෙස වී කටයුතු කිරීම.

(i) දියේ ඇන්ද ඉරක් වගේ
(ii) කබලෙන් ලිපට වැටුණා වගේ
(iii) ගඟට ඉනි කැපුවා වගේ


(14) කෙනෙකුගේ නියම ස්වරූපය තේරුම්ගත හැක්කේ ඔවුන්ගේ ක්‍රියාවෙන් බව

(i) කපන්න බැරි අත සිඹිනවා වගේ
(ii) නයාට අඳුකොළ වගෙයි
(iii) කණ කොක් සුදු පෙනෙන්නේ ඉගිලෙන විටලු

(15) පහත දී ඇති රූපවලින් ත්‍රිකෝණ 6ක් සහ සෘජුකෝණාස්‍ර 3ක් දක්නට ලැබෙන රූපය තෝරන්න.


(i)



(ii)



(iii)


(16) පැත්තක දිග 50cmක් වූ කම්බිවලින් තැනූ සමචතුරස්‍රයක් දිගහැර පැත්තක දිග 5cmවූ කුඩා සමචතුරස්‍ර කීයක් සෑදිය හැකි ද?


(i) 25 (ii) 20 (iii) 10

(17) මෙම රූපය ඝනකයක් ලෙස නමා සකස්කළ විට දැකිය හැකි ආකාරය තෝරන්න.



(i)


(ii)


(iii)



(18) සමන්ගේ කැටයේ තිබූ මුදල රුපියල් 105කි. එහි සමාන වටිනාකමින් යුත් කාසි 15ක් ද එම කාසි මෙන් දෙගුණයක් රුපියලේ කාසිද තිබුණි. සමන්ගේ කැටයේ තිබූ කාසි වර්ග අඩංගු පිළිතුර වන්නේ,

(i) රුපියලේ කාසි සහ රුපියල් 2 කාසි
(ii) රුපියලේ කාසි සහ රුපියල් 5 කාසි
(iii) රුපියලේ කාසි සහ රුපියල් 10 කාසි

(19) නියමිත ගමන් මාර්ගයේ ගමන් කරන අයෙක් ඒ ඒ කොටුවෙන් කොටුවේ වටිනාකමට සමාන කොඩි ප්‍රමාණයක් ගෙන යා යුතු නම් ඔහු පිටවන විට ගෙන යන කොඩි ගණන වන්නේ,

(i) 88 (ii) 92 (iii) 80

- **ගමන් මාර්ග ඇතුලත් කොටුව ඇසුරෙන් පිළිතුරු සපයන්න.**





(19) A ස්ථානයෙන් ඇතුල්වන අයෙකුට B ස්ථානයෙන් පිටවීම සඳහා ගමන් කළ යුතු කොටුවල අංක පිළිවෙලින් දැක්වෙන පිළිතුර කුමක් ද?


(i) 4, 6, 10, 14, 18, 24, 16
(ii) 4, 6, 18, 8, 12, 24, 16
(iii) 4, 6, 18, 24, 12, 16

(21) කම්හලක මිනිත්තු 5කදී බෝල 40ක් නිපදවයි. පැය 1 ½ කදී කොපමණ බෝල ප්‍රමාණයක් නිපදවනු ලබයි ද?

(i) 480 (ii) 720 (iii) 540

(22) මෙහි දැක්වෙන A තරාදියේ දෙපැත්තේ බර සමාන ය. B තරාදියේ දෙපස බර සමාන වීම සඳහා දකුණු පැත්තට එකතු කළ යුතු දේවල් අඩංගු පිළිතුර තෝරන්න.




(i)  (ii)  (iii) 

(23) හිස් කොටුවට ගැළපෙන රූපය තෝරන්න.



(i)  (ii)  (iii) 

- **ක්‍රියාකාරකමක් සඳහා තරිඳු පෙට්ටි කිහිපයක් පහත දැක්වෙන රූපසටහනේ ආකාරයට තබන ලදී. ඒ අනුව නිල්, රතු, කහ, කොල, දම්, රෝස, සුදු පාටවලින් යුතු එම පෙට්ටි 1 සිට 7 දක්වා අංක යොදන ලදී. පහත (24) , (25) ප්‍රශ්න සඳහා ඒ ඇසුරින් පිළිතුරු සපයන්න.**




(24) සුදු පැහැති පෙට්ටිය සියලුම පෙට්ටිවල ස්පර්ශ වී ඇත. ඒ අනුව සුදු පැහැති පෙට්ටියේ අංකය කුමක් ද?

(i) 5 (ii) 1 (iii) 3

(25) රතු පැහැති පෙට්ටියේ මුහුණත් පහක් අනෙක් පෙට්ටිවල ස්පර්ශ වී ඇත. ඒ අනුව රතු පැහැති පෙට්ටියේ අංකය වන්නේ,

(i) 6 (ii) 7 (iii) 5

- **පහත දැක්වෙන විස්තරය කියවන්න. එය ඇසුරින් ප්‍රශ්න අංක (26) හා (27) සඳහා පිළිතුරු සපයන්න.**

**අපේ ගමේ හරි මැද පන්සල පිහිටා ඇත. පන්සලේ සිට 100m ක් නැගෙනහිර දිශාවෙන් පියුශානිගේ නිවස ද 100m බස්නාහිර දිශාවෙන් සචිනිගේ නිවස ද පිහිටා ඇත. පන්සලේ සිට 100m දකුණු දිශාවෙන් යුහස්ගේ නිවස පිහිටා ඇත.**

(26) පියුශානිගේ නිවස පිහිටා ඇත්තේ යුහස්ගේ නිවසට කුමන දිශාවෙන් ද?

(i) උතුර (ii) ඊසාන (iii) බස්නාහිර

(27) පියුශානිගේ නිවසේ සිට 900mක් නැගෙනහිර දිශාවෙන් පාසල පිහිටා ඇත්නම් සචිනිගේ නිවසේ සිට පාසලට ඇති දුර කොපමණ ද?

(i) 1km 100m (ii) 1km (iii) 1km 200m

(28) නිවැරදි සම්බන්ධතාවයක් දක්වන පිළිතුර තෝරන්න.

(i) වැට බැඳීම, ගිනි තැබීම, වල් කෙටීම, බීජ වැපිරීම.
(ii) වල් කෙටීම, ගිනි තැබීම, වැට බැඳීම, බීජ වැපිරීම.
(iii) වල් කෙටීම, ගිනි තැබීම, බීජ වැපිරීම, වැට බැඳීම.

(29) අශාන් උදේ පාසලට පැමිණියේ පෙ.ව. 6.45ට සුසිල් ඊට මිනිත්තු 15කට පසු පාසලට පැමිණියේ ය. සුසිල්ට මිනිත්තු 30කට පෙර නාමල් පාසල් පැමිණියේ ය. මේ අනුව මුලින් ම පාසලට පැමිණියේ කවු ද?

(i) සුසිල් (ii) නාමල් (iii) අශාන්

(30) සයුරිගේ බර 24kgකි. සඳුනිගේ බර සයුරිගේ බරින් අඩකට වඩා 6kg වැඩි ය. සුහානිගේ බර සයුරිගේ බර සහ සඳුනිගේ යන දෙදෙනාගේ බරෙහි එකකතුවෙන් ½කි. මේ අනුව බර අඩුම තැනැත්තිය කවු ද?

(i) සයුරි (ii) සඳුනි (iii) සුහානි


(31) තිදෙනාගේ ම බර ආරෝහණ පිළිවෙලට ලියා ඇති පිළිතුර තෝරන්න.

(i) සයුරි, සඳුනි, සුහානි (ii) සුහානි, සඳුනි, සයුරි (iii) සඳුනි, සුහානි, සයුරි

(32) නිවැරදි අදහසක් දෙන වාක්‍ය තෝරන්න.

(i) පුරපසලොස්වකට පසුව අමාවක දිනය එළඹෙයි.
(ii) අමාවක දිනට පසුව පුර අටවක දිනය එළඹෙයි.
(iii) පුර අටවක දිනට පසුව අමාවක දිනය එළඹෙයි.

(33) පහත සටහනේ දක්වා ඇත්තේ මල් වර්ග පිළිබඳ තොරතුරුය. එයට අනුව,




මෙහි "B" අක්ෂරයෙන් දක්වා ඇත්තේ,

(i) රතු ඕලු මල් විය හැකි ය.
(ii) සුදු, රෝස මල් විය හැකි ය.
(iii) රතු අරලිය මල් විය හැකි ය.

- **පහත ඡේදයේ හිස්තැනට සුදුසු වචන තෝරා එයට යටින් ඉරක් අඳින්න.**


  **චන්ද්‍රයාගේ රැස්වලින් ........................................ ගල් තලාව මත දිස් වූ ස්මාරකය කාගෙත් සිත්ගත් ................................ දර්ශනයකි.**

(34) (i) සැදුණු (ii) බියවුණු (iii) නැහැවුණු


(35) (i) චමත්කාර (ii) ඛේදජනක (iii) හාස්‍යජනක

- **පහත අඳුරු කර ඇත්තේ කඩදාසි කැබැල්ලක් හතරට නවා කොටසක් කපා ඉවත්කර ඇති ආකාරයයි. එය දිග හැරිය විට නිවැරදිව පෙනෙන රූපය තෝරන්න.**


(36)




(i)



(ii)



(iii)



(37) පහත සිදුවීම් අනුපිළිවෙලට ගැළපූ විට නිවැරදි පිළිතුර තෝරන්න.

A උගේ හිස ලොකු වී පිලව් හැදුණා.
B එහි කුඩා කීටයින් දඟලමින් සිටියා.
C ටික දිනකින් මදුරුවෝ ඉගිලී ගියා.
D ටික දිනකින් මදුරු බිත්තර දක්නට ලැබුණා.
E මිදුලේ පොල්කටුව තුළ ජලය තිබුණා.

(i) E D B C A
(ii) E A B D C
(iii) E D B A C

- **පහත සිද්ධීන් සඳහා හේතුන් වශයෙන් දී ඇති ප්‍රකාශවලින් වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.**

(38) මී මැස්සෝ මලින් මලට පියඹාගොස් රොන් උරති. ඒවා උන් මීමදවල තැන්පත් කරති. ඊට හේතුව,

(i) මී පැණි ඖෂධයක් නිසා
(ii) මී පැණි ඔවුන්ගේ ප්‍රයෝජනයට ගැනීම සඳහා
(iii) මී පැණි හොඳ ඖෂධයක් නිසා මිනිසුන්ට ප්‍රායෝජනයට ගැනීමට

- **පහත දැක්වෙන ඉලක්කම් හා අකුරු පේළිය ඇසුරෙන් (39) හා (40) ප්‍රශ්නවලට පිළිතුරු තෝරන්න.**

**(3 8 C 3 C Z 8 3 M M 8 Z 3 M 8 Z 3 W W C 8 3 M Z C M 3 8)**

(39) මෙහි ඇති අකුරු සංඛ්‍යාව

(i) 13කි (ii) 15කි (iii) 14කි

(40) මෙහි ඉලක්කමක් දෙපස එකම ඉංග්‍රීසි අකුරක් යෙදී ඇත. එම අකුර වන්නේ,

(i) M (ii) C (iii) Z

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අංශයේ ප්‍රකාශනයකි.**

**5 වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව පෙරහුරු පරීක්ෂණය 2024**

**ප්‍රශ්න පත්‍ර අංක 05 - II පත්‍රය**

**විභාග අංකය : .............................. කාලය පැය :- 1 යි මිනිත්තු 15 යි.**

● පහත ඡේදය කියවන්න.

පාර දෙපස කුඹුර පැසී තිබුණි. සුනිල් වෙලට නැමී වී කරලක් කඩා ගත්තේ ය. එයින් වී ඇටය බැගින් කටින් කඩා ගෙන, දතින් පොතු ඇර කමින් ගියේ ය. අව් රැස් සැර නැති නිසාදෝ වී කුරුල්ලෝ දැන් ම ම ඒ මේ අත රංචු රංචු ඉගිලී ගියහ. ගිරවෙක් වී කරලක් ඩැහැගෙන වනාත දෙසට පියඹා ගියේ ය. වෙල මැද හිටගත් පඹයාගේ හිස මත බෙලෙක් තොප්පිය ඉරු රැසින් දිලිසුණේ ය.

අඹ යහළුවෝ
ටී.බී. ඉලංගරත්න

(01) ඡේදය ඇසුරින් පිළිතුරු සපයන්න.

(i) පාර දෙපස තිබුණේ මොනවා ද? ..............................

(ii) සුනිල් කඩා ගත්තේ කුමක් ද? ..............................

(iii) වී කුරුල්ලෝ දැන් ම ම ඒ මේ අත රංචු රංචු ඉගිලී ගියේ කුමක් නිසා ද? ..............................

(iv) ගිරවෙක් වී කරලක් ඩැහැගෙන ගියේ කොහාට ද? ..............................

(v) ඉරු රැසින් දිලිසුණේ කුමක් ද? ..............................

(vi) ''කුරුල්ලෝ ඉගිලී ගියහ.'' මෙම වගන්තිය වර්තමාන කාල ඒකවචන වැකියක් ලෙස ලියන්න.

..............................

(02) පහත සඳහන් එක් එක් වගන්තියෙහි උක්ත අඛ්‍යාත සම්බන්ධය නිවැරදි නම් ''✓'' ලකුණ ද වැරදි නම් ''✗'' ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

(i) ශිෂ්‍යාව කැපවීමෙන් ඉගැන්වීමේ කටයුතුවල නිරත වූවේ ය. ( )

(ii) ගුරුවරු කැපවීමෙන් ඉගැන්වීම් කටයුතුවල නිරත වූහ. ( )

(iii) අපි සෑම විෂය කරුණක් ම හොඳින් අවබෝධ කර ගනිමු. ( )

(iv) කඩදාසි ඔරු වතුරේ පාවුණෝය. ( )

(03) අතීත කාල බහු වචන ක්‍රියා පදය තෝරා යටින් ඉරක් අඳින්න.

(i) ගියේ ය. (ii) ගියෙමි. (iii) ගියෙමු.

(04) දී ඇති වචන ගළපා අර්ථවත් වාක්‍යයක් ලියන්න.

සිතුණි / මට / යැයි / නෙත්මිණි / කවිය / ඉතා / කිවිඳියගේ / මනරම්

..............................

(05) පහත සඳහන් එක් එක් ප්‍රශ්නයෙහි වැරදි අක්ෂරය සහිත වචනය තෝරා යටින් ඉරක් ඇඳ නිවැරදි කර එම වචනය තිත් ඉර මත ලියන්න.

(i) කාර්‍යශූර ගොවියෙකු වූ වස්තුහාමි ධනවත් පුද්ගලයෙකි. ..............................

(ii) ඔහු වහා ම ෂල්‍යකර්මයකට භාජනය කරන්න සිද්ධ වෙලා. ..............................

(06) (i) පහත සඳහන් වාක්‍ය බහු වචනයට හරවා ලියන්න.

ඇය විභාගයට පෙනී සිටියා ය.

................................................................................................

(ii) පහත සඳහන් වාක්‍ය අතීතකාල ඒකවචනයට හරවා ලියන්න.

අපි ක්‍රීඩා පිටියට ගොස් සෙල්ලම් කරමු.

................................................................................................

(07) (i) ''හික්මුණු'' යන පදයේ විරුද්ධ පදය ලියන්න. ................................................

(ii) පහත යුගල පදය සම්පූර්ණ කරන්න. ............................ මුල්ලක්

(08) පහත සඳහන් අවස්ථාවට ගැළපෙන ප්‍රස්තාව පිරුළ තිත් ඉරිමත ලියන්න.

කෙනෙකුගෙන් කෙසේවත් ලබාගත නොහැකි දෙයක් ලබා ගැනීමට උත්සාහ දැරීම.

................................................................................................................................................

(09) පහත කවියේ තුන්වන පද පේළිය සම්පූර්ණ කරන්න.

මව් පිය ගුරුවරයන් හට
කීකරු විය යුතු සැම විට
................................................
නොවෙන් අකීකරු කිසි විට

(10) එක් එක් ඉලක්කමට හා රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය දී ඇති කොටුව තුළ ඉංග්‍රීසි අකුරින් ම ලියන්න.

(i) 20 | | | | | | |

(ii)  | | | | | | | | |

(11) කොටුව තුළ ඇති වචන යොදා අර්ථවත් වාක්‍ය දෙකක් තනන්න.

| |
|---|
| My , I , One , Cat<br>have , is , black , pencil |

(i) ................................................................................................

(ii) ................................................................................................

(12) එක් එක් ඉංග්‍රීසි වචනයෙහි අර්ථය සිංහලෙන් ලියන්න.

(i) Centipede - .................................... (ii) National game -....................................

(13) දෙමළ වචන සඳහා යෙදෙන **සිංහල** වචන ලියන්න.

(i) තොණ්ණූරු - .................................... (ii) තිරාට්චෛ - ..........................................

(14) පහත සඳහන් වාක්‍ය දෙමළෙන් කියන ආකාරය **සිංහල අකුරෙන්** ලියන්න.

මට කෙසෙල් එකක් දෙන්න. ................................................................................................

(15)

| | |
|---|---|
| 8 | |
| | 9 |

මෙම ඉලක්කම් දෙක ම දෙවාරයක් යොදා ලිවිය හැකි විශාල ම සංඛ්‍යාව අකුරෙන් ලියන්න.

.................................................................................................................................

(16)

| | |
|---|---|
| 4 | 0 |
| 8 | 9 |

මෙම කුඩා කොටු තුළ ඇති ඉලක්කම් හතර ම යොදාගෙන සෑදිය හැකි කුඩා ම සංඛ්‍යාවේ ''0'' පිහිටි ස්ථානයේ ස්ථානීය අගය කුමක් ද?

....................................

(17) විසි දහසට පෙර සංඛ්‍යාවෙන් 115ක් අඩු කළ විට ලැබෙන සංඛ්‍යාවේ සංඛ්‍යා නාමය ලියන්න.

..............................................................

(18) පහත සංඛ්‍යා රටාවේ ඊළඟ සංඛ්‍යා දෙක ලියන්න.

180 , 160 , 140 , 120 , ............ , ............

(19) i සිට x තෙක් රෝම සංඛ්‍යා ලිවීමේ දී එක ම රෝම සංඛ්‍යාව තෙවතාවක් යෙදෙන රෝම සංඛ්‍යාංක කීයක් තිබේ ද?

...........................................

(20) පෙ.ව. 7.30 ට පානදුර බස් නැවතුම් පොළෙන් රත්නපුර බලා පිටත් වූ බස් රථයක් හොරණ නගරයේ දී කාර්මික දෝෂයක් නිසා මිනිත්තු 30ක් නතර කර තිබුණි. බස් රථය ගමනාන්තයට ළඟා වූයේ පෙ.ව. 11.15 ට ය. කාර්මික දෝෂය නොවුනා නම් බස් රථයට ගමනට ගත වූ කාලය කොපමණ ද?

................................................

(21) මා පාසල නිම වී නිවසට පැමිණියේ ප.ව. 2.30 ට ය. අක්කා පැමිණියේ ඊට මිනිත්තු 45 කට පසුව ය. අක්කා නිවසට පැමිණි වේලාව පැය 24 ඔරලෝසුවේ දැක්වෙන (සම්මත) ආකාරයට පහත කොටුව තුළ ලියන්න.

| | |
|---|---|
| | |

(22) අපේ පාසලේ ප්‍රාථමික අංශයේ සිසුහු 400ක් සිටිති. උත්සවයක් වෙනුවෙන් එක් සිසුවෙකුට පැන්සල් දෙකක් හා පොත් දෙකක් දීමට තීරණය විය.

(i) පැන්සල් ඇත්තේ පැන්සල් 50 පෙට්ටි ලෙස ය. එහෙයින් ගෙන ආයුතු පැන්සල් පෙට්ටි ගණන කීය ද?

...................................


(ii) සිරිදාස මහතා පොත් 375ක් පරිත්‍යාග කළේ ය. සිසුන්ට බෙදා දීමට තව පොත් කීයක් ගෙන ආ යුතු ද?

...................................

(23) පරිප්පු 1kg 250g ක මිල රුපියල් 275.00කි. පරිප්පු 1kg ක මිල කීය ද? ....................................

(24) රිබන් පටියක දිග මීටර් දහයයි සෙන්ටිමීටර් දහයකි. එය සෙන්ටිමීටර්වලින් දක්වන්න.


................................. cm

(25) 

මෙම රූපයෙන් $\frac{1}{3}$ක් පාට කරන්න.


(26) දින තුනක චාරිකාවක් පළමු දින 125km 700m ක් ද දෙවන දින 175km 850m ක් ද ගමන් කළේ ය. ගමනේ මුළු දුර 400km කි. තුන්වන දින ගමන් කළ දුර කොපමණ ද?

..............................................

(27) 


මෙම ඝන වස්තු දෙකෙහි මුළු මුහුණත් ගණන කීය ද? ..............................................

(28) දී ඇති තොරතුරු අනුව වගුවේ හිස්තැන් සම්පූර්ණ කරන්න.




| සිට | තෙක් | දුර |
|---|---|---|
| කොළඹ | මීගමුව | 35 km |
| කොළඹ | පුත්තලම | 142 km |
| හලාවත | මීගමුව | 41km |
| කොළඹ | හලාවත | ........... |

(29) ප්‍රාථමික පාසලක ශිෂ්‍ය සංඛ්‍යාව පහත ප්‍රස්තාරයේ දැක්වේ.




(i) 5 ශ්‍රේණියේ ශිෂ්‍ය සංඛ්‍යාව 1 ශ්‍රේණියට වඩා 30ක් වැඩි ය. එය ප්‍රස්තාරයේ අදාළ තීරයේ ලකුණු කර අඳුරු කරන්න.

(ii) මෙම පාසලේ 1 සිට 5 තෙක් මුළු ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණ ද? ........................................

• අංක 30 සිට 59 තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුර දී ඇති පිළිතුරු අතුරෙන් තෝරා යටින් ඉරක් අඳින්න.

(30) බණ්ඩක්කා කරලක් දික් අතට පැලූ විට එහි බීජ


(1) රටාවකට පිහිටා ඇත. (2) රටාවකට පිහිටා නැත. (3) දක්නට නොලැබේ.

(31) පෘෂ්ඨයකට ඇලී සිටීම සඳහා විශේෂ පාද ඇති සතෙකි.

(1) කැරපොත්තා (2) හූනා (3) මකුළුවා

(32) පාසලේ ඇති අලවංගුව තබා ඇත්තේ,

(1) පන්ති කාමරයේ (2) කාර්යාලයේ (3) කෘෂිකර්ම ඒකකයේ

(33) 


මෙම බෝතලයේ රූපයේ දැක්වෙන පරිදි පතුලට ආසන්නයේ A, B, C ස්ථාන තුනෙහි කුඩා සිදුරු තුනක් විද තිබේ. ඒ අනුව මෙහි අඩු ම තෙරපුමක් ලැබෙන්නේ කුමන සිදු ඇති ස්ථානයට ද?

(1) A (2) B (3) C

(34) මාර්ග නීති පිළිපැදිය යුත්තේ,

(1) මගීන් හා රියදුරන් ය. (2) රියදුරන් හා පදිකයින් ය. (3) මේ සියල්ලන් ම ය.

(35) අපේ මූලික අවශ්‍යතා වන්නේ,

(1) ජලය, හිරු එළිය, ප්‍රවාහණය
(2) ජලය, ආහාර, ආරක්ෂාව
(3) ජලය, ඇඳුම් පැලඳුම්, නිවාස

(36) සඳේ ප්‍රධාන අවස්ථා හතරෙහි නිවැරදි අනුපිළිවෙළ වන්නේ,

(1) පසළොස්වක, පුර අටවක, අව අටවක, අමාවක
(2) පුර අටවක, පසළොස්වක, අමාවක, අව අටවක
(3) පසළොස්වක, අව අටවක, අමාවක, පුර අටවක


(37) අපද්‍රව්‍ය එකතුකරන මධ්‍යස්ථාන වෙත හැර වෙනත් කිසිදු ක්‍රමයකින් බැහැර නොකළ යුත්තේ,

(1) දිරන අපද්‍රව්‍ය (2) විද්‍යුත් අපද්‍රව්‍ය (3) වීදුරු කැබලි

(38) වකුගඩු නිරෝගීවීම, සම පැහැපත් වීම, රෝගාබාධ අඩුවීම හා ප්‍රාණවත් සිරුරක් ලැබෙන්නේ,

(1) දිනපතා පලතුරු අනුභව කිරීමෙන්
(2) දිනපතා ජලය ප්‍රමාණවත් ව පානය කිරීමෙන්
(3) ශක්තිජනක ආහාර පමණක් ගැනීමෙන්

(39) මෙම රූප සටහනේ දැක්වෙන පරීක්ෂණ ඔබ කරන්නේ,




(1) දේදුන්නක් බලා ගැනීමට
(2) ජලය තුළින් හිරු එළිය ගමන් කරන බව සෙවීමට
(3) හිරු එළියේ වර්ණය ඇතිබව ප්‍රකාශ කිරීමට


(40) ගෙඩියක් / කරලක් බවට පත් වූ කොටස තිබෙන්නේ මලක පෙතිවලට
(1) උඩින් ය. (2) මැදින් ය. (3) යටින් ය.

(41) සමනලයාගේ ජීවන චක්‍රයේ නිවැරදි අනුපිළිවෙළ වන්නේ,

(1) බිත්තර, දළඹුවා, කෝෂය, සමනලයා
(2) සමනලයා, දළඹුවා, බිත්තර, කෝෂය
(3) බිත්තර, කෝෂය, දළඹුවා, සමනලයා

(42) මෙම A හා B බල්බ දෙකෙහි ආලෝකය ගැන සත්‍ය ප්‍රකාශය වන්නේ,




(1) A ට වඩා B බල්බය දීප්තියෙන් වැඩි ය.
(2) B ට වඩා A බල්බය දීප්තිය වැඩි ය.
(3) A හා B බල්බ දෙකෙහි ම දීප්තිය සමාන ය.

(43) ජල වාෂ්පයෙන් තම්බා ගන්නා ආහාරයක් නොවන්නේ,

(1) වණ්ඩු ආප්ප (2) ආප්ප (3) පිට්ටු

(44) බස්නාහිර පළාතෙන් මුහුදට වැටෙන ගංගා දෙක වන්නේ,

(1) කැලණි හා කළු ගංගා
(2) මහවැලි හා වලවේ ගංගා
(3) කැලණි හා වලවේ ගංගා

(45) ලංකාවේ පළමු වැව ලෙස ප්‍රසිද්ධ වන්නේ,

(1) බසවක්කුලම වැව (2) කලා වැව (3) පරාක්‍රම සමුද්‍රය

(46) 'ලාක්ෂා' යනු අපේ,

(1) හස්ත කර්මාන්තයකි. (2) ඇගලුම් කර්මාන්තයකි. (3) පැරණි නගරයකි.

(47) 'කුරුටු ගී' දක්නට ලැබෙන්නේ,

(1) දළදා මාලිගාවේ
(2) ඇම්බැක්කේ දේවාලයේ
(3) සීගිරියේ කැටපත් පවුරේ

(48) 'මා හුස්ම ගන්නා හඬ මට හොඳින් ඇහෙනවා'' මෙය සිත් පහන් කිරීමේ කුමන පියවරට අයත් වේ ද?

(1) පියවර 1 (2) පියවර 2 (3) පියවර 4

(49) ඔබේ හොඳ ම යහළුවා දියේ ගිලෙන්නට යන අවස්ථාවක දී ඔබ නොකළ යුත්තේ මින් කුමක් ද?

(1) උදවු ඉල්ලා කෑ ගැසීම.
(2) බේරා ගැනීමට ඔබ දියට පැනීම.
(3) දියේ පා වෙන දෙයක් ලබා දීම.

(50) සිතියම්වල දම් පාටින් මෙසේ දක්වා ඇත්තේ,




(1) මහා මාර්ග (2) දුම්රිය මාර්ග (3) අධිවේගී මාර්ග

(51) ''ගාන තෙල් සඳුන් වරලස ඔමරි කොට
මූණ පුරා තෙල් ගාගෙන යන කලට''


මෙම කවිය,

(1) ගොයම් කවියක.
(2) නෙළුම් කවියකි.
(3) පාරු කවියකි.

(52) රාජ්‍ය ලාංඡනයේ කඩුවක් අතින් ගත් පලාපෙති වටය මැද සිටින සිංහයාගෙන් නිරූපණය වන්නේ මින් කුමක් ද?

(1) රට හා විනයගරුක ජනයා
(2) එඩිතර බව
(3) සිංහල ජන නියෝජනය

(53) මෙම සුළං දිශා දර්ශකයට අනුව සුළඟ හමන්නේ,




(1) බටහිර සිට නැගෙනහිරට
(2) නැගෙනහිර සිට බටහිරට
(3) උතුර සිට දකුණට

(54) බස් රථයකට නැගීමේ හා බස් රථයෙන් බැසීමේ නිවැරදි පිළිවෙළ වන්නේ,

(1) ඉදිරිපස දොරටුවෙන් නැග පිටුපස දොරටුවෙන් බැසීම.
(2) පිටුපස දොරටුවෙන් නැග පිටුපස දොරටුවෙන් බැසීම.
(3) පිටුපස දොරටුවෙන් නැග ඉදිරිපස දොරටුවෙන් බැසීම.

(55) 'කැලණිවැලි' දුම්රිය මාර්ගයේ ප්‍රධාන ගමනාන්ත වන්නේ,

(1) කොළඹ සිට බෙලිඅත්ත
(2) කොළඹ සිට අවිස්සාවේල්ල
(3) කොළඹ සිට මඩකලපුව

(56) දිවා රාත්‍රිය ඇතිවන්නේ පෘථිවියේ,

(1) භ්‍රමණය නිසා ය.
(2) පරිභ්‍රමණය නිසා ය.
(3) චන්ද්‍රයා පෘථිවිය වටා ගමන් කරන නිසා ය.

(57) කට කොන් වනවීම සිදුවන්නේ මින් කුමන විටමින් ඌනතාවය නිසා ද?

(1) A (2) B (3) D

(58) අපේ ජාතික ක්‍රීඩාවේ, ක්‍රීඩා කරන අවස්ථාවේ සිටින මුළු ක්‍රීඩකයින් ගණන,

(1) 6කි (2) 11කි (3) 12කි

(59) ''නල්ලූර් කෝවිල'' පිහිටි පළාත වන්නේ,

(1) උතුරු
(2) උතුරුමැද
(3) නැගෙනහිර

(60) ''සෙනසුරාදා නිවාඩු දිනයක් වූ බැවින් මා සිරිමල්ගේ නිවසට ගියේ සෙල්ලම් කිරීමේ අදහසිනි. මා එහි යන විට ඔහු නංගී සමඟ සෙල්ලම් ගෙයක් සෑදීමට සූදානම් වෙමින් සිටියේ ය. මම ද ඔවුන් හා එක් වුණෙමි. .....'' ඉන් අනතුරුව සිදු වූ දේ වාක්‍ය තුනකින් ලියන්න.

(සෑම වාක්‍යයක් ම වචන පහකට නොඅඩු විය යුතු ය. උක්ත ආඛ්‍යාත සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතු ය.)

1. ..............................................................................................................................................

..............................................................................................................................................

2. ..............................................................................................................................................

..............................................................................................................................................

3. ..............................................................................................................................................

..............................................................................................................................................

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අංශයේ ප්‍රකාශනයකි.**

**5 වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව පෙරහුරු පරීක්ෂණය 2024**


**පිළිතුරු**

## ප්‍රශ්න පත්‍ර අංක 05 - I පත්‍රය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| (01) (iii) | (02) (ii) | (03) (iii) | (04) (ii) | (05) (i) | (06) (iii) | (07) (i) | (08) (iii) | (09) (iii) | (10) (iii) |
| (11) (i) | (12) (ii) | (13) (iii) | (14) (iii) | (15) (ii) | (16) (iii) | (17) (iii) | (18) (ii) | (19) (i) | (20) (ii) |
| (21) (ii) | (22) (iii) | (23) (iii) | (24) (iii) | (25) (iii) | (26) (ii) | (27) (i) | (28) (ii) | (29) (ii) | (30) (ii) |
| (31) (i) | (32) (ii) | (33) (iii) | (34) (iii) | (35) (i) | (36) (iii) | (37) (iii) | (38) (ii) | (39) (ii) | (40) (ii) |

## ප්‍රශ්න පත්‍ර අංක 05 - II පත්‍රය

(01) (i) කුඹුරු (ii) වී කරලක් (iii) අව් රැස් සැර නැති නිසා (iv) වනාත දෙසට (v) පඹයාගේ හිස මත බෙලෙක් තොප්පිය/බෙලෙක් තොප්පිය (vi) කුරුල්ලා ඉගිලී යයි. (02) (i) ✗ (ii) ✓ (iii) ✓ (iv) ✗ (03) ගියෙමු. (04) නෙත්මිණි කිවිඳියගේ කවිය ඉතා මනරම් යැයි මට සිතුණි. (05) (i) කාර්යශූර (ii) ශල්‍යකර්මයකට (06) (i) ඔවුහු විභාගයට පෙනී සිටියෝ ය. / සිටියහ. (ii) මම ක්‍රීඩා පිටියට ගොස් සෙල්ලම් කළෙමි. (07) (i) නොහික්මුණු (ii) අස්සක් (08) ඉබ්බාගෙන් පිහාටු ඉල්ලනවා වගේ (09) ඔවුන් කියන යම් දේකට (10) (i) Twenty (ii) Umbrella (11) (i) I have One pencil (ii) My Cat is black (12) (i) පත්තෑයා (ii) ජාතික ක්‍රීඩාව (13) (i) අනුව (ii) මිදි (14) එනක්කු ඔරු වාළෙප්පළම් තාරුංගල් (15) නවදහස් නවසිය අසූ අට (16) 100 (17) දහනවදහස් අටසිය අසූ හතර (18) 100, 80 (19) 2යි (20) පැය 3 මිනිත්තු 15 (21) 15 : 15 (22) (i) 16 (ii) 425 (23) රුපියල් 220.00 (24) 1010 (25)



(26) 98km 450m (27) 8යි (28) 76km (29) (i) 5 තීරයේ කොටු 4 ½ ක් පාට කර තිබීම. (110 තෙක්) (ii) 410 (30) (1) (31) (2) (32) (3) (33) (1) (34) (3) (35) (2) (36) (3) (37) (2) (38) (2) (39) (3) (40) (3) (41) (1) (42) (1) (43) (2) (44) (1) (45) (1) (46) (1) (47) (3) (48) (2) (49) (2) (50) (3) (51) (2) (52) (1) (53) (2) (54) (3) (55) (2) (56) (1) (57) (2) (58) (3) (59) (1) (60) උක්ත ආඛ්‍යාතය හා අක්ෂර වින්‍යාසය නිවැරදි අර්ථවත් වාක්‍ය තුනක් සඳහා